**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **126** - අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|

| | | |
|---|---|---|
| 1.6.1. අ (i) | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර සැසඳීම් නොකිරීම. | 1.6.1. අ (i) |
| 1.6.1 අ (ii) | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය හා ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය අතර සැසඳීම් නොකිරීම. | 1.6.1 අ (ii) |
| 1.6.1 ආ (i) | මූල්‍ය නොවන වත්කම්හි පෙර වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සමග සැසඳීම් නොකිරීම. | 1.6.1 ආ (i) |
| 1.6.1 ආ (ii) | මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම නිවැරදිව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් නොකිරීම. | 1.6.1 ආ (ii) |
| 1.6.1 ඇ (ii) | ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම. | 1.6.1 ඇ (iii) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ නිවැරදි කළ පාලන ගිණුම් ශේෂය රු.2,819,896,075ක් වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව එම ශේෂය රු.2,815,211,719 ක් වූයෙන් පාලන ගිණුම හා කේවල ගිණුම් සාරාංශය අතර රු. 4,684,356ක වෙනසක් පැවතුණි. | ණය ශේෂයන්ගේ පවතින වෙනස්කම් නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| **(ii)** | භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ ණය ශේෂය රු.**2,880,435,658** ක් වුවද නිවැරදි කළ පාලන ගිණුමේ එම ශේෂය රු.**2,819,896,075** ක් වූයෙන් භාණ්ඩාගාර පොත් හා නිවැරදි කල පාලන ගිණුම් ශේෂය අතර රු.**60,539,583** ක නොසැසඳීමක් පැවතුණි. මෙය පසුගිය වර්ෂයේ පැවති වෙනස හා සැසඳීමේදී රු. **4,268,597** ක වැඩිවීමකි. | සියලු නිලධාරීන්ගේ තොරතුරු මාසිකව ගෙන්වා ගෙන එම ණය ශේෂ සාරාංශගත කර සැසඳීම සිදුකර සංශෝධනයන් තිබේ නම් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව. | පාලන ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සමග සැසඳීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | රජයේ නිලධාරීන්ගේ ණය ශේෂයේ දෙපාර්තමේන්තු පොත් අනුව හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර වූ රු.65,223,939ක වෙනස 1984 වර්ෂයේ සිදු වූ කලබලකාරී තත්ත්වය හේතුකොට ගෙන ලේඛණ විනාශ වීමත් 1990 වර්ෂයේ ගිණුම් සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් නොවීමත් යන කාරණා මත ඇති වූවක් වුවද පෙර වර්ෂය හා සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂයේ මෙම අගය රු. 4,578,797 කින් වැඩි වී තිබුණි. තවද පසුගිය වර්ෂයේ සැසඳුම් ප්‍රකාශයේ වෙනස්කම් සමාලෝචිත වර්ෂය වනවිටත් නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි. | සියලු නිලධාරීන්ගේ තොරතුරු මාසිකව ගෙන්වා ගෙන එම ණය ශේෂ සාරාංශගත කර සැසඳීම සිදු කර සංශෝධනයන් තිබේ නම් ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ණය ශේෂවල පවතින වෙනස්කම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර ලේඛන අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.176,407,862,390 ක් වූ අතර 2023 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර ලේඛන අනුව එම ශේෂය රු.173,918,252,522 ක් වීමෙන් රු. 2,489,609,868ක වෙනසක් පැවතුණි. | සිගාස් මෘදුකාංගයට ඇතුළත් කර වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | අවසන් හා ආරම්භක ශේෂ සමාන වන ලෙස නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය. |
| (ii) | 2023 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.7,845,829,505 වන අතර මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් 2101 සිට 2104 දක්වා සහ 2106 යන වැය විෂයයන් යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දැරූ වියදම රු.20,502,458,615 ක් වීමෙන් රු.12,656,629,109ක වෙනසක් පැවතුණු අතර ඒ අනුව ප්‍රාග්ධනිත නොකළ වත්කම් වටිනාකම රු. 12,656,629,109 ක් විය. ආරම්භක ශේෂ වෙනස්වීම් සහ ප්‍රාග්ධනිත නොවූ වත්කම් හේතුවෙන් SA 82 වාර්තාවෙහි ඇතුළත් අවසන් ශුද්ධ වත්කම් ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුළත් ශුද්ධ වත්කම් ශේෂය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය සතු සත්‍ය වත්කම් ප්‍රමාණය නිරූපණය වී නොතිබුණි. | ඉදිරියේ දී සෑම මසක් අවසානයේදී එම තොරතුරු ගෙන්වාගෙන සසඳා බැලීමට කටයුතු කරන අතර ඒ පිළිබඳ අදාළ ආයතන දැනුවත් කර උපදෙස් ලබා දෙන ලද බව. | සමාලෝචිත වර්ෂයේදී අත්පත් කර ගන්නා මූලධන වත්කම් වර්ෂය තුලදී ප්‍රාග්ධනිත කල යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට හඳුනා ගනිමින් පවතින ගොඩනැගිලි හා ඉඩම් තක්සේරු වටිනාකම රු. **2,778,078,008** ක් වූ අතර එම අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ව්‍යාපෘති ඒකක විසින් ගිණුම්ගත කර ඇති අතර ගිණුම්ගත නොවූ වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂය තුලදි තක්සේරු කරන ලද වත්කම් එම වර්ෂය තුලදීම ගිණුම් ගත කල යුතුය. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 17 කට 2024 මැයි 31 දින වන විටද පිළතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිලිතුරු පසුව ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි 155 හා මුදල් රෙගුලාසි 452(1) අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරිමටත් විමසුම්වලට වහාම පිළිතුරු ලබාදීමත් සිදු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ තක්සේරු කර තිබුණු රු.10,890,720 ක් වටිනාකමැති ප්‍රවාහන උපකරණ හා අනෙකුත් යන්ත්‍රෝපකරණවලට අදාළ තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සෑම මසක් අවසානයේදීම වාර්තා ගෙන්වාගෙන සසඳා බැලීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | අත්තිකාරම් බී ගිණුමට අදාළව නැගෙනහිර පළාතේ 1990 කාලසීමාවට අයත් පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරිමට අදාළව එකතු කර ඇති රු. 22,424,325 ක් හා භාණ්ඩාගාර 7004 ගිණුම හරහා පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම් ලෙස අඩු කර ඇති රු. 48,909,855 ක මුදල්වලට අදාළ උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 1980 වර්ෂයේ සිට භාණ්ඩාගාර මුද්‍රිත සටහන්පත් ගෙන්වා ගැනීමට මහා භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීම් සිදුකර ඇති අතර නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙතද අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇති බව. | ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව ප්‍රාග්ධන වැය විෂයයන් 14 ක එකතුව රු. 228,723,738 ක හා පුනරාවර්තන වැය විෂයයන් 5 ක එකතුව රු. 390,125,490 ක, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50කට වඩා ඉතිරිවීම් පැවතුණි. | මේ සඳහා පැහැදිලි කිරීම් ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව . | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් **8**ක එකතුව රු.**81,000,000** ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය වර්ෂය අවසානයේ ඉතිරිව පැවතුණි. | අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කල යුතුය. |
| (ඇ) | පාසල් සෞඛ්‍ය පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම පළාත් සභා වෙත පවරා දී තිබියදීත්**,** වැය විෂයය අංක **126-01-02-001-1501** යටතේ පාසල් සෞඛ්‍ය පෝෂණ වැඩසටහන වෙනුවෙන් රු.**2,500,000,000** ක ප්‍රතිපාදන වෙන් කරගෙන වර්ෂය අවසානය වනවිට ඉන් සියයට **94**ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පාසල් ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා වෙත වෙන්කරන ලද මුදල් අදාළ පළාතේ පාසල් ආහාර වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන සියලුම ජාතික හා පළාත් පාසල් සඳහා යොදාගත් බැවින් ජාතික පාසල් වෙත මුදල් වෙන් කිරීමක් අවශ්‍ය නොවූ බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කල යුතුය. |
| (ඈ) | ඇස්තමේන්තුගත මුල් ප්‍රතිපාදනය ඉතිරි වී තිබියදිත් මු.රෙ.**66** මාරු කිරීම් යටතේ ප්‍රතිපාදන ලබාගෙන සියයට **100** ක්ම ඉතිරි වී තිබුණු වැය විෂයයන් **02** ක් පැවතුණි. තවද වැය විෂයයන් **07**ක් සඳහා මු.රෙ.**66** මගින් රු.**241,300,000** ක ප්‍රතිපාදන මාරු කර තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.**230,928,516** ක ප්‍රතිපාදන එනම් සියයට **96** ක් ඉතිරි වී පැවතුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව. | නිසි අවශ්‍යතා සලකා බලා අවශ්‍ය වන්නා වූ වැය විෂයයන් සඳහා පමණක් ඇස්තමේන්තු පිළියෙළ කිරීමටත් ප්‍රතිපාදන මාරු කර ගැනීමටත් කටයුතු කල යුතුය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 17 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු. 66,412,710ක බැරකම්වලට බැඳීම් ඇති කරගෙන තිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිපාදනයෙන් ඉතිරිය ඉක්මවා බැරකම් ඇති කර නොගත යුතුය. |
| (ආ) | උසස් අධ්‍යාපන අංශයට අයත් රු. 696,103,548 ක් හා නිපුණතා අංශයට අයත් රු. 46,596,226 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණි. | මෙම තත්ත්වය ඉදිරියේදි ඇති නොවීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **38** වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.16 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | සියලුම විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 104(3)(4) | | අවස්ථා 08 කදී සිදු වී තිබුණු වාහන අනතුරු, අස්ථානගතවීම්, ඌනතාවයන් හා ගිනිගැනීම් යනාදී පාඩු සම්බන්ධයෙන් ප්‍රාථමික හා අවසන් වාර්තා නිකුත් කර පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 චක්‍රලේඛය | | රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර පැමිණීම හා පිටවීම සලකුණු කල යුතු බවත් පැමිණීම හා පිටවීම සඳහා ලේඛණයක් නඩත්තු කරන්නේ නම් ඇඟිලි සලකුණු යන්ත්‍ර | පිළිතුරු සපයා නොමැත. | අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | භාවිතා කිරීමේ ක්‍රමයට අමතරව කළ යුතු බව දක්වා තිබුණු නමුත් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සනාථ කිරීමට පාසල් 02 ක කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | මුදල් අමාත්‍යාංශය චක්‍රලේඛ<br><br>2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/ 2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 වගන්තිය | | **I.** සමාලෝචිත වර්ෂය අවසානයට නිපුණතා අංශයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම තුල 2020 වර්ෂයේ සිට බාහිර පාර්ෂවයන්ට පරිහරණය සඳහා ලබාදුන් රු. මිලියන 13 ක් වටිනා වාහන 04 ක වටිනාකම ඇතුලත් වී තිබුණු අතර එම වාහන අදාල ආයතනවලට පවරාදී වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන පවරා දීමට කටයුතු කරමින් පවතින බව | අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| | | | **ii.** ආර්ථික කටයුතු අමාත්‍යාංශය සතු රු. මිලියන 4.3 ක් වටිනා වාහනයක් 2020 වර්ෂයේ සිට භාවිතා කරනු ලැබුවත් එම වාහන අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය ඇවර කර ඇති බැවින් වාහනයේ හිමිකාරිත්වය සම්බන්ධයෙන් කරුණු විමසීමක් කර ඇති බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017/4/27 දිනැති හා අංක EST-EXAMS-05-1007-06 දරන ලිපිය | 7,418,540 | රාජකාරියේ නියුතු නිලධාරින්ට උපරිම පැය 03 කට යටත්ව හා විශ්‍රාමික නිලධාරින්ට උපරිම පැය 6 කට යටත්ව සම්පත්දායක දීමනා ගෙවීමට නිර්දේශ කර ඇති නමුත් එම විෂයානුබද්ධ රාජකාරියට අයත් විවිධ අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරිම, චක්‍රලේඛ සකස් කිරීම , ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම වැනි දේශන ස්වරූපයේ නොවන කාර්යයන් වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් සඳහා 2023 වර්ෂයේදී සම්පත් දායක දීමනා ලෙස ලිපියේ | සෘජුව පුහුණු කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බැවින් මෙලෙස සකසන වැඩසටහන් පවත්වනු ලැබේ.දේශන ස්වරූපයෙන් පැවැත්වීමට නොහැකි අතර ඒවා වැඩමුළු ස්වරූපයෙන් පැවැත් වේ. නීතිරීති | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | උපදෙස්වලට පටහැනිව ගෙවා තිබුණි. | රෙගුලාසිවලට අනුව සම්පත්දායක ගෙවීම් සිදු කර ඇති බව. | |
| (ඉ) | අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ | | | |
| | 2023 අප්‍රේල් 25 දිනැති අංක 17/2023 දරන අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයේ (ඇ) ඡේදය | ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යූහ කමිටුවේද පළාත් පාසලක් නම් පළාත් ව්‍යූහ කමිටුවේද තීරණයක් නොමැතිව පන්ති /සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නොකළ යුතු වුවද, ව්‍යූහ කමිටු අනුමැතියකින් තොරව අතරමැද පන්ති සඳහා නව පන්ති ආරම්භ කර තිබුණි. | එහෙත් සමහර පාසල්වල පන්ති කාමර ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, ප්‍රතිඵල පාදක කර ගනිමින් සිසුන් බෙදා ඉගැන්වීම, ද්වි මාධ්‍ය පන්ති වෙන්කර ඉගැන්වීම ආදී හේතු මත පන්ති කාමර සංඛ්‍යාව භෞතිකව වැඩිකර ගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| | 2017 ජුනි 21 දිනැති අංක 21/2017 දරන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1 මාර්ගෝපදේශය | පාසල් සඳහා ලබා දී ඇති අන්තර්ජාල පහසුකම් වලට අදාළ ප්‍රතිවෛරස් මෘදුකාංග කාලීනව යාවත්කාලීන කල යුතු වුවත් කිසිදු පාසලක එම යාවත්කාලීන කිරීම් සිදුකර නොතිබුණි. | දි ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස පාසල් හා පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | 2012 නොවැම්බර් 30 දිනැති අංක 40/2012 දරන චක්‍රලේඛය | විෂයමාලා සංශෝධනවලට අනුකූලව කල්පවතින උපකරණ, රසායනික ද්‍රව්‍ය සහ වාෂ්පශීලී ද්‍රව්‍ය ලැයිස්තුව වසර 05 කට වරක් සංශෝධනය කළ යුතු බව සඳහන් වුවද වසර 09 ක් ඉක්මවා ගියද ලැයිස්තුව සංශෝධනය කර නොතිබුණි. | විෂයය මාලා චක්‍රය වසර 08කට ක්‍රියාත්මක වන බැවින් සහ 2015 වර්ෂයේ දී සිදු වු විෂයය මාලා ප්‍රතිසංස්කරණ යේදී විද්‍යා විෂය නිර්දේශය ප්‍රායෝගික පරීක්ෂණවල විශාල වෙනස් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වීමක් සිදු වී නොමැති බව. | |
| 2007 දෙසැම්බර් 13 දිනැති අංක 20/2007 දරන චක්‍රලේඛය | වඩාත් පහසු පාසල් වර්ගීකරණයට අයත් පාසලක ගුරුවරයෙකුගේ සේවා කාලය උපරිම අවුරුදු 6 ක් ලෙස නියම කර තිබුණද පරීක්ෂා කරන ලද වඩාත් පහසු පාසල් 04ක වසර 10 ට වැඩි සේවා කාලයක් ඇති ගුරුභවතුන් 113 ක් සේවයේ නිරත වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ජාතික පාසල් ගුරුවරුන් සම්බන්ධ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ප්‍රකාරව නියමිත කාලය සම්පූර්ණ කළ ගුරුවරුන් ස්ථාන මාරුකිරීම්වල ට යටත් කළ යුතුය. |
| 2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර ගිවිසුම<br>3.2 ඡේදයේ වගන්තිය (f) | ගිණුම් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඇතුලත SEPI Loan Scheme – Phase 11 සම්බන්ධයෙන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වගකීම මහ බැංකුව සතු වියයුතු වුවත් 2016 සිට මේ දක්වා එසේ කටයුතු කර නොතිබුණි. | සෑම වසරකම පෙබරවාරි මස 28 දින ගිණුම් වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන බව. | නියමිත දිනට ගිණුම් වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතුය. |
| ගිවිසුමේ 2.2 ඡේදයේ වගන්තිය (b) | ණය මුදල් ලබාදීමට අදාල වන සියළුම ඉල්ලුම්පත් නිපුණතා සංවර්ධන අංශය හරහා ඉදිරිපත් කල යුතු වුවත්, නිපුණතා අංශයේ මැදිහත් වීමකින් තොරව 2022 හා 2023 වර්ෂයන් සඳහා ලියාපදිංචි කල ප්‍රතිලාභීන් 123 දෙනෙකුගෙන් ප්‍රතිලාභීන් 47 දෙනෙකු වෙනුවෙන් රු. 35,100,000ක ණය මුදල් ලබාදී තිබුණි. | ව්‍යවසායක පුහුණු වැඩසටහන් පවත්වා එම වැඩසටහන් අවසන් කළ බවට තහවුරු කිරීමෙන් පසුව NVQ සහතික පත්‍රය නිරීක්ෂණය කර ණය නිකුත් කරනු ලබයි. අමාත්‍යාංශය | අදාල ගිවිසුමේ සඳහන් කරුණු වලට අනුව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | විසින් සෘජුව අයදුම්පත් නිරීක්ෂණය කිරීම ප්‍රායෝගික නොවන කාර්යයක් බව. | |
| (ඊ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි XII වැනි පරිච්ඡේදයේ 165 සහ 166 රීති | 8,063,393 | මාතර රාහුල විද්‍යාලයේ ගුරු සේවයේ රාජකාරී ඉටුකරන ලද ගුරුවරයකු විදුහල්පතිගේ නිර්දේශ නොමැතිව හා පත්වීම් බලධරයාගේ අනුමැතියකින් තොරව 2006 මැයි 05 දින සිට අවිධිමත් ලෙස වෙනත් සේවාවකට තාවකාලිකව මුදාහැර තිබුණ ද 2006 මැයි 05 සිට 2023 ජූලි 31 දක්වා වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | මුදා හැරීම විධිමත් කරගත යුතු අතර ගෙවූ වැටුප් ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය සතු රජයට පවරාගත් පාසල්වල දේපල වෙනත් පුද්ගලයෙකුට බදුදීමට බස්නාහිර පළාත් සභාවට නෛතික හැකියාවක් නොතිබියදී බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පර්චස් 40 කින් යුත් කො/පිංචත්ත උපනන්ද පාසලේ භූමිය හා ගොඩනැගිලි 2008 නොවැම්බර් 01 දින සිට වසර දෙකක කාලයක් සඳහා පෞරාණික රුකඩ කලා ආයතනයක් පවත්වාගෙන යාමට පුද්ගලයෙකු වෙත බදුදීමට කටයුතු කර තිබුණු අතර බදු කාලය අවසන් වී තිබුණද දේපල නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද පාසලක් වැසීම සඳහා පාසල් ව්‍යූහ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් ඉහළ වටිනාකමකට මිල කළ හැකි රජයේ ඉඩමක් බාහිර පුද්ගලයෙකුට අනවසරයෙන් භුක්ති විඳීමට ඉඩකඩ ලබා දී තිබුණි. | දෙහිවල ප්‍රාදේශීය ලේකම් ගල්කිස්ස මහේත්‍රාත් අධිකරණයේ ගොනුකල නඩුවෙන් පෙත්සම්කරු ඉඩමෙන් නෙරපා සන්තකය ආපසු ලබා ගන්නා ලෙසට අධිකරණ නියෝග ලබා දී ඇති බව. | අධිකරණ නියෝග අනුව කටයුතු කර දේපල පවරා ගත යුතු අතර මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය විධිවිධාන චක්‍රලේඛ මගින් අදාල පාර්ශවයන් දැනුවත් කළ යුතුය. |
| (ආ) | මාතර රාහුල විද්‍යාලයේ ඉඩමෙන් පර්චස් 3.7955 ක ප්‍රමාණයක් මාතර ගොඩගම අධිවේගී පිවිසුම් මාර්ගය සඳහා ඉඩම් අත්පත් කරගැනීම යටතේ රජයට පවරා ගැනීමේදී වන්දි හා පොළී වශයෙන් ලැබුණු | පිළිතුරු ඉදිරිපත් කර නැත. | භාරය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන විද්‍යාලයේ වර්තමාන හා අනාගත සිසුන්ගේ |

| | | |
|---|---|---|
| රු.4,935,613 ක් අබේගුණසේකර ට්‍රස්ට් නමින් වූ බැංකු ගිණුමකට බැරකර විගණිත දිනය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | | ප්‍රයෝජනය සඳහා එම මුදල් යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව. |
| (ඈ) මාතර රාහුල විද්‍යාලයේ වාහන අංගනයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විදුහල්පති හා ආදි ශිෂ්‍ය සංගමයේ භාණ්ඩාගාරික අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමේ 06 ඡේදය පරිදි මාතර දිස්ත්‍රික් ඉංජිනේරුගේ (ගොඩනැගිලි) අනුමත සැලැස්ම සහ ඇස්තමේන්තුව අනුව ව්‍යාපෘතිය නිම කළ යුතු වුවත් ඊට පටහැනිව, වැඩ අයිතම 12 ක් අනුමත ඇස්තමේන්තුවේ සඳහන් මිල ගණන් ඉක්මවා සිදුකිරීම වෙනුවෙන් එකතුව රු. 1,754,911 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මාතර රාහුල විද්‍යාලයේ වාහන අංගනය සකස් කිරීම හා භූමි අලංකරන ව්‍යාපෘතිය සඳහා අතුරන ලද අන්තර් සම්බන්ධිත කුට්ටිගල් රජයේ ඉදිකිරීම්වලදී භාවිතා කළ යුතු සම්මත ප්‍රමාණයේ කුට්ටිගල් නොවූයෙන් ඒවායේ සම්පීඩ්‍යතා ශක්තිය මැන බැලීමට විගණනයේ දී ද නොහැකි විය. ඒ අනුව රජයේ රසායානාගාරවල පරීක්ෂණ සඳහා යොදාගත නොහැකි ප්‍රමාණයේ ෂඩස්‍රාකාර කුට්ටිගල් අතුරා ඇස්තමේන්තුවේ දැක්වුණු සම්පීඩ්‍යතා ශක්තිය පිළිබඳ රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තා නොමැතිව එම වැඩ විෂයය වෙනුවෙන් රු. 2,195,817 ක මුදලක් ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.6 තැන්පත් ශේෂන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 04ක, වර්ෂ 5ක් ඉක්ම වූ එකතුව රු.85,770,479 ක් වූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | වර්ෂ දෙකක් ඉකුත් වූ තැන්පතු ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ දැක්ම මෙහෙවර හා කාර්යයභාරය අනුව ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | සිසු පරපුරේ හා රටේ උන්නතිය උදෙසා වර්තමාන ලෝකයට |

| | | | |
|---|---|---|---|
| | විශ්වාසයකින් යුතුව ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | | ගැලපෙන ප්‍රාථමික,ද්විතියික හා තෘතීයික යන අධ්‍යාපන මට්ටම් තුළින් සිසුවෙකු ළඟා වී තිබිය යුතු අපේක්ෂිත මට්ටම් හා එම මට්ටමේ ලෝක අධ්‍යාපනය පිළිබඳ දර්ශක හා සැසඳීමේදී අප රටක් ලෙස ළඟාවිය යුතු මට්ටමට යා හැකි ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කල යුතුය. |
| (ආ) | “නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී සමාජයක්” හා “දැනුමෙන් වෘත්තීය නිපුණතාවයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහිකිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මඟින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම” දැක්ම හා මෙහෙවර කරගත් මෙම අමාත්‍යාංශයේ 2020, 2021, 2022 කාර්යසාධන වාර්තාවන් හා 2023 කෙටුම්පත් කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේදී අමාත්‍යාංශය පසුගිය වර්ෂ 04 පුරාවටම එකම අභියෝගයන්ට දිගින් දිගටම මුහුණ පා තිබුණද එම අභියෝගයන් සාර්ථකව ජයගැනීම සඳහා විධිමත් ස්ථිර ක්‍රමෝපාය සහිත සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වී නොතිබුණි. | 2020,2021 හා 2022 මුල් භාගය කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදකාරි තත්ත්වය හමුවේ වෘත්තිය අධ්‍යාපන ක්ෂේත්‍රය සෘජු පසුබෑමකට ලක් වූ කාල පරිච්ඡේදයකි. ඒ හේතුවෙන් පර්යේෂණ හා නව නිපැයුම් අංශය මුහුණ දී ඇති අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම පිණිස ජාතික පර්යේෂණ කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශ මට්ටමින් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන ඇත. මේ තුළින් පර්යේෂණ අංශය මුහුණ පාන අභියෝග අවම කිරීමට බලාපොරොත්තු වන බව. | ස්ථිර ක්‍රමෝපාය සහිත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 සැලසුම් කිරීම

2023 වර්ෂයට අදාලව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

## 3.3 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව 2023 වර්ෂයේ අපේක්ෂිත කාර්යයන් සඳහා වූ මුළු ඇස්තමේන්තුගත වියදම රු.29,954,974,900 ක් වුවද ප්‍රගති වාර්තාව අනුව සත්‍ය වියදම රු.10,915,445,500 ක් වී තිබුණි. ඒ අනුව මුළු ප්‍රතිපාදනයෙන් රු.19,039,529,400 ක් හෙවත් සියයට 64ක් ඉතිරි වී තිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්ම අනුව හා ප්‍රගති වාර්තාව අතර ඇස්තමේන්තු ගත වියදමෙහි රු.8,208,104,000 ක වෙනසක් පැවතුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල හැකි ලෙස සැලසුම් සකස් කිරීමටත් සකස් කරන ලද සැලසුම් සාක්ෂාත් කර ගැනීමටත් කටයුතු කල යුතුය. |
| (ආ) | 2023 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබූණු නමුත් කිසිඳු ප්‍රගතියක් ලඟාකර නොගත් අංශ 22කට අයත් කාර්යයන් 57ක් පමණ වූ අතර, එහි ඇස්තමේන්තු වටිනාකම රු.437,427,000ක් විය. ඇස්තමේන්තු වටිනාකම හඳුනාගත නොහැකි ක්‍රියාකාරකම්ද ඒ අතර පැවතුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල හැකි ලෙස සැලසුම් සකස් කිරීමටත් සකස් කරන ලද සැලසුම් සාක්ෂාත් කර ගැනීමටත් කටයුතු කල යුතුය. |
| (ඇ) | ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සහිත පුහුණු ශ්‍රමිකයන් විදේශ වෙළඳපොල විවිධ රැකියා ක්ෂේත්‍රයන්ට යොමුකිරීම අරමුණු කරගෙන 2021 පෙබරවාරි 09 දින නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය හා විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර මෙම ගිවිසුමේ ප්‍රධාන අරමුණු ලෙස පුහුණු ශ්‍රමිකයන් 100,000 ක් විදේශගත කිරීම ඉලක්ක කරගෙන තිබුණි. විගණිත දින දක්වා වාර 05 කදී පුහුණුලාභීන් 1,606 දෙනෙකුගේ තොරතුරු පමණක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමුකර තිබුණු අතර එය සියයට 2 ක් පමණ වූ අඩු මට්ටමක පැවතුණි. විදේශ සේවානියුක්ති කාර්යාංශය වෙතින් අවස්ථා 02 කදී ලැබී තිබූ රැකියා අවස්ථා 33,596 ක් සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුලාභීන්ගේ තොරතුරු විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලබාදීමට අඛණ්ඩව කටයුතු කරන අතර, එම කාර්යාංශය මඟින් එම තොරතුරු අදාළ රැකියා නියෝජිත ආයතනවලට ලබා දීමට කටයුතු කරන බව. ඒ අනුව මෙම තොරතුරු හරහා අදාළ නියෝජිත ආයතන විසින් පෞද්ගලික පුහුණුලාභීන් විදෙස්ගත කිරීමට කටයුතු කරන බව. | අරමුණු ගත ඉලක්කයන් කරා ළඟා වීමට කටයුතු කළ යුතු අතර විදේශ රැකියා ක්ෂේත්‍රය තුල ඉහල ඉල්ලුමක් පවතින රැකියා සඳහා පුහුණුලාභීන් යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යටතේ 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ප්‍රතිලාභීන් 1,362 දෙනෙකු සඳහා රු. මිලියන 757 ක් ණය ලබාදීම ඉලක්ක කරගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් 1,418 කින් ප්‍රතිලාභීන් 1,156 දෙනෙකුට රු.මිලියන 526 ක් ණය ලබාදී තිබුණි. | 2020, 2021, 2022 හා 2023 වර්ෂවල ඇතිවූ කොරෝනා තත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් පසුබෑමක් පෙන්නුම් කර ඇතත් 2024 වර්ෂය වන විට මෙම තත්වය මඟහරවා 2024.03.31 වන විට ලියාපදිංචි 82ක ණය අයඳුම්පත් අතුරින් 35ක් සඳහා රු.මිලියන29.7ක ණය නිකුත් කර ඇති බව. | මෙම ණය යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවන සේ ලියා පදිංචි කළ ප්‍රතිලාභීන්ට සාපේක්ෂව ණයලාභීන් ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සූර්ය පැනල මූලාකෘති ව්‍යාපෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයා දෙන විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අධ්‍යාපනික පුහුණු වැඩසටහන සඳහා 2016 අප්‍රේල් 06 දින ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදී තිබූ අතර දේශීය අරමුදල් රු. මිලියන 240 ක දායකත්වයෙන් 2017 වර්ෂයේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂය අවසන් වන විට මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 47 ක් පමණක් විය. ක්ෂේත්‍රයේ සිටින සූර්ය පැනල පිළිබඳ කාර්මිකයින් **(Solar Technicians)** 3,500 එක්කර ගැනීමට හා විශ්වවිද්‍යාලවල විදුලි බලය ජනනය කිරීම සඳහා යොදාගත හැකි සූර්ය පැනල 10 ක් නිපදවීම මෙහි අරමුණු වුවද මේ වන විට අවුරුදු 07 ක් ගත වී තිබියදීත් **Laboratory Scale Prototype Solar Panel** 04 ක් පමණක් නිපදවා තිබුණි. | මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටු කරගැනීමට විවිධ වූ බාධක එල්ල වීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සියල්ලම ඉටුකර ගැනීම නොහැකි වී ඇති අතර අරමුණු කිහිපයක් පමණක් ඉටුකරගෙන තිබෙන බව. | ව්‍යාපෘතියේ අරමුණුවලට අප්‍රමාදව ලඟාවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තරුණ සේවක හැකියා වර්ධනය, තෘතියික වෘත්තීය අධ්‍යාපන හා ස්වයං රැකියා සාර්ථකත්වය යන ප්‍රතිඵල අපේක්ෂා කරමින් ඇමරිකා එක්සත් ජනපද රජය විසින් ඩොලර් මිලියන 06 ක ආධාරයෙන් You lead Phase II ව්‍යාපෘතිය 2021 – 2024 කාල පරිච්ඡේදය වෙනුවෙන් ආරම්භ කර තිබුණු අතර එහි මඟපෙන්වීම හා අධීක්ෂණය කිරීමේ වගකීම නිපුණතා අංශයට පැවරී තිබුණ නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී මැදිහත් වීමක් නිරීක්ෂණය නොවුණි. සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා වියදම් වාර්තා පරීක්ෂා කිරීමේදී එම මාස 08 ට අදාල බඳු හැර මුළු වියදම රු. 600,759,163 ක් වූ අතර ඉන් සියයට 58 ක්ම ගමන් වියදම්, සෘජු වියදම් හා අනෙකුත් පරිපාලන වියදම් වෙනුවෙන් දරා තිබුණි. | **You lead** ව්‍යාපෘතිය අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා සම්බන්ධවද වැඩසටහන් ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීම කළ හැකි වූයේ අමාත්‍යාංශය යටතේ වන ආයතන හරහා ක්‍රියාත්මක වූ වැඩසටහන් සඳහා පමණක් බව. | ව්‍යාපෘතියේ මඟ පෙන්වීම හා අධීක්ෂණ කටයුතුවලට අමාත්‍යාංශය ක්‍රියාකාරීව මැදිහත් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී **NVQ** හා **NNVQ** පාඨමාලා සඳහා පිළිවෙලින් 7865 දෙනෙකු හා 5429 දෙනෙකු ලෙස එකතුව 13294 දෙනෙකු අඩුවෙන් බඳවාගෙන තිබුණු අතර එය අපේක්ෂිත බඳවා ගැනීම් වලින් සියයට 24ක අඩුවීමක් විය. | වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා වසර අවසාන වන තෙක් බඳවාගැනීම් සිදුකරනු ලබන බැවින් ඉලක්ක සපුරා ගැනිමේ ප්රගතිය නිවැරදිව තීරණය කිරිම අපහසු බව. | පුහුණු පාඨමාලා සඳහා බඳවාගැනීමේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීම පිළිබඳ ඔස්ට්රියානු ව්යාපෘතිය යටතේ ඉදිකළ තුන්මහල් නව ගොඩනැගිල්ල සහ වැඩහල් ගොඩනැගිල්ල සඳහා රු.326,155,114 ක් ගෙවා තිබුණ ද 2021 දෙසැම්බර් 06 දිනට තක්සේරු වටිනාකම රු.51,750,000 ක් වී තිබුණි. ඒ අනුව ගොඩනැගිලි භාවිතයට ගැනීම ආරම්භ කර වසරක් තුළ ගොඩනැගිල්ලේ වටිනාකම රු.274,405,114 කින් අසාමාන්ය ලෙස අඩු වී තිබුණි. එමෙන්ම මෙම ව්යාපෘතිය යටතේ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබිය යුතු රු.13,730,656 ක පුහුණු උපකරණ ලැබී නොතිබුණි. | මෙම ව්යාපෘතිය මගින් ලබාදුන් **GRN** නිකුත් කළ වත්කම් ගිණුම්ගත කිරීමටත් ගොඩනැගිලි වටිනාකම් සම්බන්ධ ලබාදුන් විස්තර අනුව **NAITA** ආයතනයට 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී අදාළ වටිනාකම් ගිණුම් ගත කිරීමට උපදෙස් ලබාදෙන ලදී. ඉදිරි ප්රගති විමසීම් කටයුතු අමාත්යාංශය මඟින් සිදු කරමින් පවතින බව. | සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ව්යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වසරේ සිට 2020 වසර දක්වා ක්රියාත්මක වූ ළඟම පාසල හොඳම පාසල ජාතික වැඩසටහනට අදාළව රු.5,439,907,245ක බැරකම් ප්රමාණයක් තිබියදී ව්යාපෘතිය 2020 දෙසැම්බර් 31 නිමාවකින් තොරව අවසන් කර තිබුණි. එසේම ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන ආරම්භ කර දළ වශයෙන් රු.මිලියන 2285.2 ක පමණ මුදලක් වැයකර පාසල් 23 ක් පමණක් ජාතික පාසල් බවට පත්කර අතරමැද නවතා දමා තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | ආරම්භ කරන ලද ව්යාපෘති නියමත පරිදි අවසන් කර අපේක්ෂිත ප්රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ළඟම පාසල හොඳම පාසල ව්යාපෘතිය යටතේ මධ්යම පළාත තුල අන්යෝන්ය එකඟතාවය මත අවසන් කල රු.367,341,909 ක් වටිනා කර්මාන්ත 45 ක්ද, ප්රතිපාදන සීමාවීම මත කොටසක් ඉදිකල රු.351,839,473 ක් වටිනා කර්මාන්ත 32 ක්ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවතුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | ආරම්භ කරන ලද ව්යාපෘති නියමත පරිදි අවසන් කර අපේක්ෂිත ප්රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ද්විතියික පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩ සටහන තුළින් පාසල් තුළ තාක්ෂණික විද්යාගාර ඉදිකිරීමේ ව්යාපෘතිය යටතේ රු. 24,689,403 ක් වැයකර විද්යාගාර 03 ක වැඩ අතරමඟ නවතා දමා තිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. | ආරම්භ කරන ලද ව්යාපෘති නියමත පරිදි අවසන් කර අපේක්ෂිත ප්රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට්පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021, 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු. මිලියන 100 ක්, රු.මිලියන 200 ක් වෙන්කර තිබුණි. 2022 වර්ෂයේ කැගල්ල ප්‍රදේශයේ පමණක් මෙම නගර විශ්වවිද්‍යාලය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් තෝරාගෙන ඒ වෙනුවෙන් රු.මිලියන 16.738ක් වියදම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද රු. මිලියන 200 ක ප්‍රතිපාදනයක් වෙන් කරවාගෙන රු.මිලියන 1.202 ක් වැය කර ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණු අතර වැය කළ රු. මිලියන 18 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අංක 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය මඟින් රාජ්‍ය වියදම් සඳහා සීමා පනවා තිබූ බැවින් සැලසුම් කරන ලද කාර්යයන් ඒ අයුරින් සිදු කිරීමට නොහැකි විය. | නව ඉදිකිරීම් වලින් බැහැරව තිබෙන සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම ඇතුළු අරමුණු කිහිපයක් මත 2019 ජූනි 24 දින රු.මිලියන 1,138.5ක වටිනාකමකට **කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය** පුද්ගලික සමාගමක් වෙත පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජූනි 16 දින වැඩ නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද 2024 ජූනි මස 05 වන දින දක්වා දින දීර්ඝ කිරීම් ලබාගෙන තිබුණි. එහෙත් 2024 පෙබරවාරි 29 වන දින වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 64ක් පමණක් විය. | විවිධ හේතු නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය ආරම්භයේදී මන්දගාමී වුවද සාර්ථකව අවසන් කිරීමට කටයුතු කරමින් සිටින බව. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු වලට ලඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අදාල නිලධාරීන් වගබලා ගත යුතුය. |
| (ආ) | කරාපිටිය වෛද්‍ය පීඨයට ඇතුලත් කරගන්නා සිසුන් සංඛ්‍යාව වැඩිකිරීම හා පර්යේෂණ ධාරිතාවය (Research Capabilities) වැඩි කිරීම් අරමුණ සහිතව උසස් අධ්‍යාපන අංශය විසින් රසායනාගාර, විභාග හා දේශන ශාලා පහසුකම් වැඩි කිරීම වෙනුවෙන් රු. මිලියන 1,092 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2020 ජූනි 01 වන දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය වෙත **රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම්** කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2021 සැප්තැම්බර් 06 වන දින වැඩ නිම කිරීමට අපේක්ෂිතව තිබුණද 2024 අප්‍රේල් 05 දින දක්වා දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණු නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ මහල් 10 ක් දක්වා කොන්ක්‍රීට් තට්ටු (concret Slab) දැමීම සිදුකර | ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම සහ වෙළඳපොළ තුළ ඉදිකිරීම් ද්‍රව්‍යවල පවතින හිඟවීම යනා දී කරුණු සහ නියමිත පරිදි කොන්ත්‍රාත් කරු වෙත මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාර මුදල් නිදහස් නොවීම වැනි හේතු මත මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතියද වර්තමානයේ දී කඩිනමින් වැඩ නිම වෙමින් පවතින බව. | ව්‍යාපෘතියේ අරමුණු වලට ලඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අදාල නිලධාරීන් සැලසුම් කල යුතුය. |

| | | |
|---|---|---|
| 07 වැනි මහල දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරීමේ කටයුතු පමණක් සිදුකර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට වියදම රු. මිලියන 1015.87 ක් වුවත් භෞතික ප්‍රගතිය සියයට 50ක මට්ටමේ පැවතුණි. | | |
| (ඇ) **රුහුණු විශ්වවිද්‍යාලයේ සමසෞඛ්‍ය විද්‍යා පීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය** | | |
| උසස් අධ්‍යාපන අංශය විසින් වෛද්‍ය රසායනාගාර පුහුණුලාභීන්ගේ හිඟය මගහරවා ගැනීමේ ප්‍රමුඛ අරමුණ සහිතව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල නව පාඨමාලා 4 ක් ආරම්භ කර එමඟින් වසරකට උපාධිධාරීන් 350 ක් පමණ බිහිකිරීම සහ සමාජ ක්‍රියාකාරකම් සහ ලෙඩ රෝග ආදිය නිසා අත්පා අහිමිවූවන්ට නවීන තාක්ෂණික ක්‍රමවේදවලට අනුකූලව නිර්මාණය කරනු ලබන කෘත්‍රිම උපාංග නිෂ්පාදනය කර සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ලබාදීමේ අරමුණු සහිතව ඉහත පීඨය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 03 දින කොන්ත්‍රාත්කරුවකු වෙත රු.මිලියන 1,501 කට ප්‍රදානය කර තිබුණි. මෙම **ව්‍යාපෘතිය** 2023 ජූනි 02 දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණද 2024 අප්‍රේල් 10 දින දක්වා දින දීර්ඝ කිරීම් කොන්ත්‍රාත්කාර සමාගම විසින් ලබාගෙන තිබුණු නමුත් 2024 අප්‍රේල් 10 වන දින විටද ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 1398.07 ක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 91 ක් විය. | කොවිඩ් වසංගතය ,රටේ පැවති ආර්ථික අර්බුදය, වෙළඳපොළ තුළ ඉදිකිරීම් ද්‍රව්‍යවල පැවතන හිඟවීම හා ප්‍රමාණවත් පරිදි මුදල් නොලැබීම හේතුවෙන් අපේක්ෂිත කාල වකවානුවලට කාර්යය නිමකිරීමට නොහැකි වී ඇත. වර්තමානයේ දී ඉතා කඩිනමින් අවසන් අදියරේ කටයුතු සිදුකරන අතර ඉතා මෑතකදී ගොඩනැගිලි සංකීර්ණය සිසු අයිතියට පත් කිරීමට නියමිත බව. | ව්‍යාපෘතියේ අරමුණු වලට ලඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අදාල නිලධාරීන් සැලසුම් කල යුතුය. |
| (ඈ) **රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිළිබඳ ඒකකයක් පිහිටුවීම** | | |
| මූලික සමුද්‍ර ඉංජිනේරු සහ නාවුක නිර්මාණ (Naval architecture) උපාධි පාඨමාලා (Degree Programme) සහ නාවුක අධ්‍යයන, බෝට්ටු සහ නැව් නිර්මාණ කර්මාන්තය සඳහා පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සංවර්ධන සහ අත්‍යාවශ්‍ය රසායනාගාර උපකරණ මිලදීගැනීම, පවත්නා උපාධි වැඩසටහන් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය විශේෂිත ඉංජිනේරු වැඩමුළු පැවැත්වීම යන මූලික අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් උසස් අධ්‍යාපන අංශය විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2019 මැයි 28 දින මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත රු. මිලියන 436.5 ක වටිනාකමකට මෙම ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර එම ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව 2021 ජූලි 31 දින වන විට වැඩ නිම කල යුතුව තිබුණි.අවස්ථා කිහිපයකදී දින දීර්ඝ කර අවසාන වශයෙන් 2024 නොවැම්බර් 26 වන දින දක්වා දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. ගිවිසුම අනුව 2024 පෙබරවාරි 29 දින වන විට ව්‍යාපෘතියේ පිරියත, යන්ත්‍ර හා උපකරණ ලබාගැනීම සිදු කල යුතුව තිබුණද ඒ වෙනුවෙන් 2022 වර්ෂයේ වෙන්කල රු.මිලියන 5ක | ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් රු.මිලියන 400 ක මුදලක් වෙන් කර තිබුණද ප්‍රසම්පාදන කාල රාමුව තුල මිලියන 400 ක ප්‍රතිපාදනයක් 2023 වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සම්පූර්ණයෙන් උපයෝජනය කල නොහැකි බව සඳහන් කරමින් එම මුදලින් රු.මිලියන 232 ක් රුහුණු විශ්වවිද්‍යාලයේ වෙනත් ව්‍යාපෘතියකට මාරු කරන ලෙස විශ්වවිද්‍යාලය විසින් දන්වා තිබුණු බැවින් එම මුදල වෙනත් ව්‍යාපෘතියකට මාරු කෙරිණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්වූ සියලු ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස 2023 වර්ෂයේ දී උපයෝජනය කර ඇති බව. | ප්‍රතිපාදන වෙන් කරන ලද අරමුණ වෙනුවෙන් ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් ව්‍යාපෘතියේ අරමුණු වලට ලඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට කටයුතු නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන එම වර්ෂය අවසානයේදී ඉතිරිව පැවතිණි. ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ වෙන්කර තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 42ක් පමණක් වර්ෂය අවසාන වන විට උපයෝජනය කර තිබුණි. | | |
| (ඉ) | **ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**<br><br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ උසස් අධ්‍යාපන අංශය විසින් 2016 මාර්තු 24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම යටතේ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර එමඟින් කුවේට් ඩිනාර් මිලියන 10 ක ණය මුදලක් ලබාදීමට එකඟ වී තිබුණි. රු.මිලියන 4,514 ක් වැයකර පීඨ ගොඩනැඟිලි සංකීර්ණ ඉදිකිරීම අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොන්ත්‍රාත් අක්‍රිය වී එහි භෞතික ප්‍රගතිය සියයට 10 මට්ටමේ පැවතුණි. ව්‍යාපෘතිය තුළින් මිලදී ගතයුතු ඉගෙනුම් උපකරණ මිලදී ගැනීමේ ප්‍රගතිය සියයට 40 මට්ටමේ පැවති අතර 2022 ජුනි 08 වන දින සිට ණය මුදල ලබාදීම අත්හිටුවා තිබුණු බැවින් ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කර තිබුණි. | ණය ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය අවසන් වී ශ්‍රී ලංකා රජය විසින් විදේශ ණය සැපයුම් කරුවන් වෙත හිඟ ණය වාරික ආපසු ගෙවන තෙක් කුවේට් අරමුදල මඟින් මුදල් නිදහස් නොකරන බව. ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය භාණ්ඩාගාරය වෙත පැහැදිලි කිරීමෙන් අනතුරුව උපකරණ මිලදීගැනීම සඳහා දේශීය මුදලින් රු.මිලියන 300 ක් 2024 වර්ෂය සඳහා වෙන්කරදීමට පියවර ගෙන ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණු වලට ලඟා විය හැකි පරිදි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අදාල නිලධාරීන් වගබලා ගත යුතුය. |
| (ඊ) | **මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**<br>2021 මාර්තු 22 දිනැති අංක ED/HE/PL/2021/18 දරන අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව දැනට ජාතික සෞඛ්‍ය ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සඳහා සේවය ලබාගත හැකි වෛද්‍යවරු සංඛ්‍යාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය මත උසස් අධ්‍යාපන අංශය විසින් මෙම වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණි. 2023 පෙබරවාරි 13 දින දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය ආයතනයේ (SAITM) සහ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ (NFTH) යටිතල පහසුකම් සහ අනෙකුත් සම්පත් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත ලබා ගැනීමට 2021 අප්‍රේල් 20 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමුකර තිබුණද වාර්තාවේ දිනය දක්වාම අනුමැතිය ලැබී නොතිබුණි. එසේ වුවද කණ්ඩායම් 03 ක් බඳවාගැනීම සිදුකර තිබියදී පීඨ සංකීරණයක් හා සායනික පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් නොමැති වීම නිසා 2023 වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදිත රු.මිලියන 50 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | දැනට බඳවාගෙන ඇති ශිෂ්‍ය කණ්ඩායම් සඳහා වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහලේ පුහුණු පහසුකම් සැපයීමේ කටයුතු සඳහා මේ වන විට වැඩ කටයුතු සිදු කරමින් පවතින බව. රජය විසින් ණය වාරික හා පොලිය නොගෙවීමට මත ඔවුන් විසින් ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් කිරීම සිදු නොකරයි. ණය මුදල සක්‍රිය තත්ත්වයට පත් වුවහොත් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම සඳහා මෙම රු.මිලියන 50 ක මුදල් වෙන්කර ගෙන තිබුණද ණය මුදල සක්‍රිය තත්ත්වයට පත් නොවූ හෙයින් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි බව. | ඒ ව්‍යාපෘතියේ අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2016 පෙබරවාරි 11 දිනැති කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයෙන් පසුව මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලැබී නොමැති බැවින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති අතර විද්‍යා හා තාක්ෂණ කර්මාන්ත උද්‍යානයක් ආරම්භ කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව. | අමාත්‍යාංශයට අදාල වත්කම් පවරා ගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රම වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් සහිත පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම් ඉහළ නැංවීම පිණිස නිපුණතා අංශය විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වෙත රු. මිලියන 41.33 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද අත්කරගත් මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 2.85 ක් පමණක් විය. | විවිධ වූ හේතූන් නිසා මෙම වැයවිෂයෙහි ප්‍රතිපාදන උපයෝජනය නොවූ අතර ලේකම්ගේ අනුමැතිය මත ප්‍රතිපාදන වලින් කොටසක් වෙනත් වැය විෂයන් වෙත මාරු කරන ලද බව. | සැලසුම් කල කාර්යයන් ඉටු කර වෘත්තීය පුහුණු අංශය සංවර්ධනය කිරීමට අදාළ බලධාරීන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | තරුණ පරපුර වෘත්තීය පුහුණුව වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා ටෙක් උද්‍යාන වැඩසටහන යටතේ කාර්මික විද්‍යාල හා තාක්ෂණික විද්‍යායතන ඒකීය ගෘහ නිර්මාණ ශිල්පීය ආකෘතියක් යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 300 ක ප්‍රතිපාදන වෙන්කරදී තිබුණද වර්ෂ අවසානයට වියදම රු. මිලියන 87.25 ක් වූයෙන් අත්කරගෙන තිබුණු මූල්‍ය ප්‍රගතිය සියයට 29 ක් පමණක් විය. | පසුගිය කාලවකවානුව තුළ ඉදිකිරීම් අමුද්‍රව්‍යවල නිරන්තරයෙන් මිල විචලනය සිදුවීම මත ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාමාර්ග ගැටළුකාරීව පැවතුන බව. | අපේක්ෂිත ව්‍යාපෘතීන් අප්‍රමාදව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.8 වෙනත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ මහ/ධර්මරාජ විද්‍යාලයේ සෞන්දර්ය ගොඩනැගිල්ල පිටුපස බැම්මක් ඉදිකිරීම සඳහා මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ රු.3,215,887 කට 2011 සැප්තැම්බර් 06 ගිවිසුම්ගත වී තිබූ අතර රු.4,036,784 ක් බැම්ම නිම කිරීම සඳහා ගෙවා තිබුණි. එහෙත් 2021 නොවැම්බර් 08 දින වන විට බැම්ම අස්ථාවර තත්ත්වයට පත් වී තිබුණි. | රුඳවුම් බැම්ම අස්ථාවර වීමට වූ හේතූන් සොයා බැලීමට රාජ්‍ය ආයතනයක් වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | නිවැරදි කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග ඉතා කඩිනමින් සිදුකළ යුතුය. |
| (ආ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු ප්‍රතිපාදන මත මහ/ ධර්මරාජ විදුහලේ ආපනශාලාව ඉදිකිරීමේ කටයුතු සිදුකර ඒ වෙනුවෙන් රු.4,400,000 ක මුදලක් 2023 සැප්තැම්බර් 18 දින වනවිට කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙම කර්මාන්තයේ වැඩ අතරමග නවතා තිබුණු අතර 2022 දෙසැම්බර් 20 දින ද්විපාර්ශවීය එකඟතාවය මත කර්මාන්තය අවසන් කර තිබුණ ද ඉදිකළ ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විට කායවර්ධන මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කර තිබුණි.නායයාමේ අවධානමක් ඇති භූමියක ඉදිකර ඇති මෙම ගොඩනැගිල්ල සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ද ලබාගෙන නොතිබුණි. | ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ලබාගෙන නොමැති බව හා රජයේ ප්‍රතිපාදන වෙන් වුවද මුදල් නොලැබීම නිසා මෙම කර්මාන්තය නතර කිරීමට සිදුව ඇති බව. | ගොඩනැගිලි ඉදිකිරීමට පෙර අදාළ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, ප්‍රතිපාදන ලබාගෙන වැඩ අවසන් කර, අරමුණුගතව යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.9 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය වන විට ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා රෙගුලාසි සකස් කිරීමට හා රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා නිති සැකසීමට අපේක්ෂා කර තිබුණද ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ පිළිබඳව ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය මැයෙන් සිදුකරන ලද විශේෂ කාර්යයසාධන වාර්තාවේද එහි අවශ්‍යතාවය අවධාරණය කර තිබුණි. | ජාත්‍යන්තර පාසල් නියාමනය සම්බන්ධ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිදු නොවන බව පෞද්ගලික පාසල් ශාඛාව විසින් දැනුවත් කර ඇති බව. | පවත්නා නීතිමය බාධක හඳුනාගෙන පවත්නා රෙගුලාසි සංශෝධනය කර අධ්‍යාපනය සම්බන්ධ කාර්යයන් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නියාමනය වන පරිදි නිර්නායක සකස් කළ යුතුය. එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය යටතේ වාර්ෂික බලපත්‍රයක් ලබා ගතයුතු පරිදි ක්‍රමවේදයක් සකස් කර අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2011 වර්ෂයේ සිට ද්විතියික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන , ළඟම පාසල හොඳම පාසල ජාතික වැඩසටහන, ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යන වැඩසටහන් 03 ක් ආරම්භ කර තිබුණද එක් වැඩසටහනක හෝ පූර්ණ ප්‍රගතියක් අත්කර ගැනිමට ප්‍රථමව තවත් වැඩසටහනක් ආරම්භ කර තිබුණි. අදාළ කාල සීමාව තුල වැඩසටහන් හඳුන්වා දීමත් ඉන් කොටසක් ඉටු කිරීමත් පමණක් දක්වා තිබුණද, එම වැඩසටහන් නිමකිරීම සම්බන්ධ කිසිඳු කාර්යයසාධන වාර්තාවක තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ආරම්භ කරන ලද වැඩසටහන නියමිත කාල පරිච්ඡේදය තුළදී නිම කිරීමෙන් පසු නව වැඩසටහන් ආරම්භ කල යුතු අතර ඒ ඒ වැඩසටහන් අනුව ප්‍රගතිය සමාලෝචනය කරමින් පසුවිපරම් කිරීම් සිදු කළ යුතුය. |

## 3.10 විදේශාධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | | **ද්විතීක අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහන පිළිබඳ විගණන පරීක්ෂාව (SESIP)** | | |
| | (i) | 2023 වර්ෂය සඳහා ප්‍රධාන විසර්ජන සබැඳි දර්ශක 07 යටතේ උප විසර්ජන සබැඳි දර්ශක 22ක් වෙනුවෙන් ඩොලර් මිලියන 98.93 ක් වෙන් වී තිබුණද එම උප විසර්ජන සබැඳි දර්ශක 22 තුළ 2021 හා 2022 වර්ෂයේ දී ලගා කර නොගත්, උප විසර්ජන සබැඳි දර්ශක 12 ක් ඇතුලත් ව තිබුණි. වර්ෂය තුල දී මෙම කිසිඳු විසර්ජන සබැඳි දර්ශකයන් ලඟාකර නොගැනීම මත 2023 වර්ෂයේ වැඩසටහන සඳහා වෙන් වී තිබුණු ඉහත මුළු මුදලම ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ක්‍රියාත්මක කිරිම ප්‍රමාද කිරිමට සිදුවු බැවින් **2023** වර්ෂයට අදාල රු මිලියන **98.93** ක මුල්‍ය ප්‍රදානය ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය මත **2024** වසර දක්වා කල් දැමීමට සිදු වූ බව | ඉලක්කගත විසර්ජන සබැඳි දර්ශකයන් නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීමට වගබලා ගත යුතුය. |
| | (ii) | සමාලෝචිත වර්ෂය වන විට ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දි තිබුණු මූල්‍යමය ඉලක්කය ඩොලර් මිලියන 381.88 ක් වුවද ලඟා කරගත් ප්‍රමාණය ඩොලර් මිලියන 216.27 ක් හෙවත් සියයට 57 ක් පමණක් විය. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය මේ දක්වා අනුමත නොවීම මත 2023 වර්ෂයේ නියමිත ඉලක්ක කරා යාමට නොහැකි වීම මත කාර්යයසාධනය අපේක්ෂිත ඉලක්කයට වඩා පහල මට්ටමක පවතී. | අපේක්ෂිත ඉලක්ක නියමිත කාල රාමු තුල ලගා කර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹී ණය ගිවිසුමෙහි දෙවන වගන්තියේ උප වගන්ති 2.02/2.03 ප්‍රකාරව ශ්‍රී ලංකා රජය ලබාගත් ණය මුදල් ප්‍රමාණය මත වෙනස් වන පොළී අනුපාතය යටතේ පොළී මුදලට අමතරව නිදහස් කර නොගත් ණය මුදල් ප්‍රමාණය මත 0.15 ක බැදීම් ගාස්තුද ගෙවිය යුතු වේ. අමාත්‍යාංශය විසින් විසර්ජන සබැදි දර්ශක ක්‍රියාත්මක කිරිම ප්‍රමාද වීම මත රු. 103,350,603 ක බැදීම් ගාස්තු ගෙවා තිබුණු අතර එය නිශ්කාර්ය වියදමක් වී තිබුණි. 2021,2022 වර්ෂවලදී රට තුළ පැවති කොවිඩ් ව්‍යසනය, ආර්ථික අර්බුදය, දේශපාලන අස්ථාවරත්වය පිළිබදව භාණ්ඩාගාරය හරහා ලිඛිතව ආසියානු සංවර්ධන බැංකුවට කරුණු දක්වමින් බැදීම් ගාස්තු ඉවත් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | ණය ගිවිසුම ප්‍රකාරව නිදහස් කර නොගත් අගයට බැදීම් ගාස්තු ගෙවීමට සිදුවන අතර ලබා ගත් ණය ප්‍රමාණයට පොළියද ගෙවිය යුතු බව. | රට මුහුණපාන ව්‍යසනයන්, පිළිබදව භාණ්ඩාගාරය හරහා ලිඛිතව ආසියානු සංවර්ධන බැංකුව දැනුවත් කර බැදීම් ගාස්තු ඉවත් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කළ යුතුය. |
| (iv) | මෙහෙයුම් කමිටු වාර්තා අනුව දැනටමත් මෙම වැඩසටහන විවධ හේතුන් මත පසුබෑමට ලක්ව ඇති බවත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව අනුව යමින් ක්‍රියාත්මක කිරිමටත්, දැනටමත් සකස් කර ඇති විෂයමාලා ඒ හා යමින් සංශෝධනය කිරීමටත් , නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් පිළිබඳ සමාජය තුළ විශ්වාසනීයත්වය ගොඩනැගිමත් යන පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඉතා දීර්ඝ කාලයක් ගතවන බැවින් මෙම නව වැඩසටහන 2027 වර්ෂය දක්වා දීර්ඝ කළ යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශය (MOE), ජාතික අධ්‍යාපන ආයතනය(NIE) හා විභාග දෙපාර්තමේන්තුව(DOE) එක්ව තීරණය කර තිබුණද විගණිත දිනය වන විටත් ආසියානු සංවර්ධන බැංකුව හා එක්ව ඒ සම්බන්ධව එකඟතාවයකට පැමිණ නොතිබුණි. | වැඩසටහන අවසන් කරන කාලය තීරණය කිරීමට කටයුතු කරනු ඇති බව. | නියමිත කාලරාමුව තුළ වැඩසටහන ක්‍රියාත්මක කල යුතුය. |
| (v) | 2023 පෙබරවාරි 14 දිනැති අංක අමප/23/0103/604/010 දරන ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති කළමණාකරණ ඒකක සමාලෝචනය සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව SESIP ව්‍යාපෘතියෙහි කාර්ය මණ්ඩලය 10 දක්වා අඩු කිරිමට අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් 2023 දෙසැම්බර් 31 දිනට තනතුරු 19 ක නිලධාරීන් සේවයේ යොදවා තිබුණු අතර ඒ තුළ පළාත් ඇගයීම හා නියාමන නිළධාරින් 09 දෙනෙකු හා පළාත් සම්බන්ධීකරණ නිලධාරින් 06 දෙනෙකු ඇතුලත්ව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කිසිදු විසර්ජන සබැදි ඉලක්කයක් ලඟා කරගෙන නොතිබියදීත් මෙම පළාත් නියෝජිතයන් වෙනුවෙන් ගෙවා තිබුණු රු.6,300,000 ක දීමනා නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2024 පෙබරවාරි 12 දින සිට 12ක කාර්යය මණ්ඩලයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කාර්ය මණ්ඩලය අඩු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2023 නොවැම්බර් 10 දින තෝරාගත් පාසල් 285ක් සඳහා රු.16,000,000ක මුදලක් පාසල් සංවර්ධන සමිති ගිණුම් වෙත බැරකර තිබුණි. 2024 මාර්තු 31 දිනට ලද තොරතුරු අනුව පාසල් 08 ක් විසින් රු. 421,980ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණු අතර උපයෝජන කාලය 2024 මැයි 31 දක්වා තවදුරටත් දීර්ඝ කර තිබුණි. | මුදල් උපයෝජනය කිරීමේ කාලය **2024** මැයි **31** දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරන ලද බැවින් මේ වන විට අදාළ ප්‍රගතිය පිළිබඳ වාර්තා ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | අරමුණු ඉටු කර ගැනීමට අදාල කාර්යයන් භාර නිලධාරීන් වගබලා ගත යුතුය. |
| (vii) | පළාත් 09 ම ආවරණය වන පරිදි, SESIP වැඩසටහන ක්‍රියාත්මක පාසල් සහ රසායනික ද්‍රව්‍ය හා රසායනාගාර උපකරණ අවශ්‍යතා පවතින අනෙකුත් පාසල් අතුරින් තෝරාගත් පාසල් 233ක් සඳහා විද්‍යාගාර උපකරණ හා රසායන ද්‍රව්‍ය මිලදීගැනීම සඳහා, එක් පාසලක් වෙනුවෙන් රු.200,000 බැගින් රු.46,600,000ක මුදල් ප්‍රතිපාදනයක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත 2023 ජූලි 31 දින නිකුත් කර තිබුණි. අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා) විසින් නිකුත් කරන ලද 2023 සැප්තැම්බර් 21 දිනැති ලිපිය ප්‍රකාරව නොවැම්බර් 10 ට පෙර ඉහත මුදල් වියදම් කර අවසන් කළ යුතු වුවද 2024 මාරුතු 31 දින පාසල් 73ක් පමණක් ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව එදිනට රු. 13,021,754ක් පමණක් වියදම් කර තිබුණු අතර එය මුළු ප්‍රතිපාදන වටිනාකමින් සියයට 28ක් පමණක් වී තිබුණි. | අදාළ තොරතුරු පාසල්වලින් ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින බව. | තෝරාගත් පාසල් සඳහා අදාළ උපකරණ මිලදීගෙන සිසුන් හට උපයෝජනය කිරීමට සැලැස්වීම මගින් කාර්යයසාධනය ළඟාකර ගැනීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |
| (viii) | 2022 වර්ෂයේදී ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා තොරාගත් පාසල් 750ක ඉලක්කගත විෂයයන් 13ක සාධනීය මට්ටම ඉහළ නැංවීම සඳහා රු.295,000,000ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණු නමුත් ඉන් සියයට 91ක් හෙවත් රු.270,000,000ක් වසරේ අවසන් කාර්තුවේදී ලබාදීම හේතුවෙන් එම කාර්යය 2023 වර්ෂය දක්වා විතැන් කර එම මුදල් වියදම් කර අවසන් කළ යුතු දිනය 2024 අප්‍රේල් 31 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් 2024 මාර්තු 31 දින වන විටද මුදල් උපයෝජනය කළ ආකාරය පිළිබඳ ප්‍රගතිය අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන ශාඛාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 මාර්තු 31 දිනට ප්‍රගතිය පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් වෙතින් ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින බව. | ප්‍රතිපාදන ලබාදීමේ දීම අපේක්ෂිත ඉලක්ක ලගා කර ගත හැකි අයුරින් පෙර අත්දැකීම් ද මත සකස් කළ ප්‍රශස්ත වැඩපිළිවෙලක් හඳුන්වා දී ඒ අනුව භෞතික හා මූල්‍ය ප්‍රගතියද සමඟ උපයෝජනය කිරීමේ ප්‍රගතියද ලබාගෙන කාර්යයසාධනය ළඟාකර ගැනීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ix) | වාර්ෂික විසර්ජන සබැඳි දර්ශක ඉලක්කයන් ළඟාකර ගැනීමට අදාළ 2022 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳ අධ්‍යනය කිරීමකින් තොරව 2023 වර්ෂය සඳහා ජාතික පාසල් 171ක් හා පළාත් පාසල් 579ක් වෙත රු.209,027,000ක ප්‍රදානයක් ලබා දී තිබුණි. 2022 වර්ෂයේ ලබා දී තිබූ ප්‍රදානවල උපයෝජන කාලසීමාව වරින් වර දීර්ඝ කර තිබියදී 2023 වර්ෂය සඳහා ප්‍රදානද 2023 සැප්තැම්බර් 26 දින ලබා දී තිබුණි. එම මුදල් උපයෝජන කාලසීමාවද වරින් වර දීර්ඝ කර 2024 අප්‍රේල් 30 ලෙස අවසන් වරට සංශෝධනය කර තිබුණි.ඒ අනුව අපේක්ෂිත ඉල්ක්ක නියමිත වර්ෂය තුළ ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල් උපයෝජනය කිරීමේ දිනය දීර්ඝ කිරීමට සිදු වූ බව පිළිගන්නා බව. | ප්‍රතිපාදන ලබා දීමේදී අපේක්ෂිත ඉලක්ක ලගා කර ගත හැකි අයුරින් පෙර අත්දැකීම් ද මත සකස් කළ ප්‍රශස්ත වැඩපිළිවෙලක් හඳුන්වා දී ඒ අනුව භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමඟ කාර්යයසාධනය ළඟාකර ගැනීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |
| (x) | විසර්ජන සබැඳි දර්ශක 07 යටතේ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වෙත ලැප්ටොප් පරිගණක 328 ක් මිලදී ගැනීම, පළාත් 09 තුළ NEMIS දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුම කාර්යසාධන වාර්තා ආංශික ප්‍රතිමාන (Sector Indicators) අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය තුළ ප්‍රසිද්ධ කිරීම යන කාර්යයන් 2025 වර්ෂය වන විට සිදු කිරීමට සැලසුම් කර තිබුණි. එම ඉලක්ක ලඟා කර ගැනීම වෙනුවෙන් 2021,2022 හා 2023 වර්ෂ තුළදී උප විසර්ජන සබැඳි දර්ශක අංක 53,55 හා 56 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා ඇ. ඩො.මිලියන 7ක් වෙන් වී තිබුණි. එහෙත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඉලක්ක ලඟා කර නොගැනීම නිසා එම ඩොලර් මිලියන 7 ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | තොරතුරු පද්ධතිය මඟින් තොරතුරු ලබා ගෙන අදාළ විසර්ජන සබැඳි දර්ශක 2024 වසරේදී ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | අපේක්ෂිත ඉලක්ක නියමිත කාලය තුල ඉටු කර ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතුය. |
| (xi) | ලැප්ටොප් පරිගණක 328 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය 2023 ජූලි ආරම්භ කර 2023 දෙසැම්බර් 15 දින පෞද්ගලික ආයතනයක් වෙත රු.79,548,000 ක වටිනාකමට ලංසු පිරිනමා තිබුණි. අදාළ ලැප්ටොප් පරිගණක පිරිවිතර වලට අනුකූල වන බවට තහවුරු කර ගැනීමකින් තොරව 2024 මාර්තු 08 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙහි මධ්‍යම ගබඩාව වෙත බාර ගෙන තිබුණී. ලැප්ටොප් පරිගණක 328 ම අදාල පිරිවිතර වලට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | පිරිවිතර වලට අනුකූල වන බවට තහවුරු කර ගැනීමකින් පසුව පමණක් භාණ්ඩ භාර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (xii) | සමාලෝචිත වර්ෂයේදී මෙම **SESIP** වැඩසටහන යටතේ විභාග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.97,000,000 කින් රු.5,662,072 ක් පමණක් වැය කර තිබූ අතර ඒ අනුව 2023 වර්ෂයේ දී ලබා කර නොගත් ප්‍රගතිය සියයට 94 ක් වී තිබුණි. | විසර්ජන හා සබැඳි දර්ශක වලට අදාළ ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාත්මක කල බැවින් ළඟා කර ගත් ප්‍රගතිය සියයට 6 ක් පමණ වූ බව පිළිගන්නා බව. | ප්‍රතිපත්තිමය තීරණ වලට සමගාමීව විසර්ජන සබැඳි දර්ශකවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා කර ගැනීමට අදාල බලධාරීන් වගබලා ගත යුතුය. |
| (xiii) | 2023 වර්ෂයේ දී ද්විතීයික අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහන සඳහා ජාතික අධ්‍යාපන ආයතනය වෙත රු.50,000,000 ක ප්‍රතිපාදන වෙන් වී තිබුණද විෂයමාලා සංවර්ධනය තාවකාලිකව නවතා දැමීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ කිසිදු විසර්ජන සබැඳි දර්ශක ඉලක්කයක් සපුරාගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රතිපත්තිමය තීරණ සමග විසර්ජන සබැඳි දර්ශක කඩිනමින් ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | **ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සිථාපිත කිරීම.** 2019 නොවැම්බර් 05 වන දින කොරියන් Exim බැංකු මූල්‍ය දායකත්වයෙන් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන තුනක් ඉදිකිරීම සඳහා ඇ.ඩො. 35,663,773 ක ණය ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් ණය ගිවිසුම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ණය ගිවිසුම 2023 මැයි 10 දින අවසන් වූ බැවින් තවත් මාස 33 කින් ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද සංශෝධිත ණය ගිවිසුම අත්සන් කිරීම 2024 මාර්තු 31 දින වන විටත් සිදුකර නොතිබුණි. | ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා හේතුවෙන් මෙම ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම සංශෝධනය කිරීම ප්‍රමාද වන බව කොරියානු **EXIM** බැංකුව විසින් දන්වා එවා ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම තීරණය කර ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | **ඉන්දියානු රජයේ ආධාර යටතේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ** ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂයේ දී අවසන් කර තිබුණි. මෙම පාසල සඳහා පරිගණක උපාංග හා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් රු. 6,658,405 ක ප්‍රතිපාදනයන්ට අදළ ප්‍රසම්පාදන කටයුතු විගණිත දිනය 2023 මාර්තු 20 දින වන විටත් අවසන් වී නොතිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් වී වසර 04 ක් ඉක්මවා තිබියදිත් මෙම ව්‍යාපෘතියට අදාළ උපකරණ මිලදීගැනිම අවසන් කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | එකඟ වෙමි. අදාල ප්‍රසම්පාදන කටයුත්ත ඉදිරියේදී අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරන ලෙස දන්වා ඇති බව. | පාසල්වල භෞතික සංවර්ධනය තුළින් දරුවන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම.**<br>2013 වසරේදී උසස් පෙළ විෂය ධාරාව යටතේ තාක්ෂණවේදය විෂය හඳුන්වාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කොරියානු රජයේ ආධාර යටතේ, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් කුලියාපිටිය ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා කොරියානු ජනරජයෙන් ඇ. ඩොලර් මිලියන 14.95 ක ආධාර සහ දේශීය අරමුදල් ලබාගැනීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂය දක්වාම ප්‍රමාද වීම හේතුවෙන් සංශෝධිත කාර්යබද්ධ පත්‍රිකාවට අනුව කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහයෝගීතා ඒජන්සිය (KOIKA) මෙම ව්‍යාපෘතියෙහි වගකීම අමාත්‍යාංශයට පවරා දී ඉදිකිරීම් සඳහා ඇ:ඩො: ලක්ෂ 08 ක මුදලක් 2021 වසරේ දෙසැම්බර් මහා භාණ්ඩාගාරයට ලබා දී තිබුණි. 2016 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය විවිධ හේතූන් මත ප්‍රමාද වීම නිසා මෙම කොන්ත්‍රාත්තුව කඩිනමින් ඉටු කර ගැනීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය (CECB) වෙත ලබා දී තිබුණ ද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මස බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව 2024 ජනවාරි 31 දිනට ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 47 ක් පමණ විය. | 2022 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භයත් සමග මේ වන විට ඉදිකිරීම් වල සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 55 පමණ අත්පත් කරගෙන ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලනය තුළින් කොන්ත්‍රාත්තුව මනාව හැසිරවීමට අදාළ බලධාරීන් කටයුතු කර, ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට වගබලා ගත යුතුය. |
| (ඉ) | **පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම**<br>ඉන්දියානු ජනරජයේ ආධාර යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීමේ අදියර 1 සඳහා 2016 දෙසැම්බර් මස 07 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර 2019 ජනවාරි 09 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘති කාලය ඉක්මවා මාස 11කට පසු ඉන්දියානු රජය ගිවිසුම අවලංගු කර තිබුණු අතර සියයට 42 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අදියර 3 කදී උපදේශන ගාස්තු වශයෙන් **CECB** ආයතනයට රු.11,881,577 ක මුදලක් ගෙවා තිබුණි. ඉදිකිරීම් කටයුතු නිමවීමකින් තොරව සිදුවූ ප්‍රමාදයට එම ආයතනය විසින් ඉල්ලුම් කර ඇති මුළු උපදේශන ගාස්තුව රු.6,367,091 ක් වී තිබුණි. නව කොන්ත්‍රාත්කරු ඉවත් වීම හේතුවෙන් මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගමට රු.200,664,128 ක නව කොන්ත්‍රාත් මුදලකට ලබා දී තිබූ අතර පෙර මිල හා සැසඳීමේදී පිරිවැය රු.13,863,566 කින් ඉහළ ගොස් තිබුණි. 2023 අගෝස්තු 31 දින ඉන්දියානු මහාකොමසාරිස් කාර්යාලය විසින් මෙහි විෂය | විෂයපථය යම් අඩු කිරීමක් කර ඇස්තමේන්තුවක් ලබාගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේද එකඟතාවය මත දෙවන කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුවට අතිරේකයක් (ගිවිසුමක්) 2024 අප්‍රේල් 29 දින අත්සන් කර මේ වන විට එම කාර්යය ඉටු කිරීම ආරම්භ කර ඇති බව හා රටේ පැවැති අනාරක්ෂිත තත්ත්වය මත මෙම තත්ත්වය උදා වී ඇත. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් එම කාර්යය නිමකිරීමෙන් පසු ඉතිරිය නිමකිරීම සඳහා රජයේ | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට වගබලා ගත යුතුය. |

| | | |
|---|---|---|
| පථය අඩු කිරීම හේතුවෙන් ගොඩනැගිල්ල ප්‍රතිපාදනයක් අපේක්ෂිත අරමුණ සඳහා භාවිතයට ගැනීමට නොහැකි වීමේ අවධානමක් පැවතුණි. | සලසා ගැනීමට සිදු වී ඇති බව. | |

**3.11 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **3.12** ප්‍රසම්පාදනයන් | අමාත්‍යාංශය විසින් ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ළමා මිතුරු වැඩසටහන සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.3,223,210 ක් ඉතිරි වී තිබුණු අතර එම මුදල් දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත නොයවා ටෙන්ඩර් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2021 වර්ෂයට අදාළ මේ වන විට වර්ෂ දෙකක් ඉක්ම වූ තැන්පතු මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කරනු ලබන බව . | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවතින මුදල් ශේෂ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරයට මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු.1,804,834 ක් වූ ගුණාත්මකභාවයෙන් තොර රසායන ද්‍රව්‍ය 144 ක් පාසල් 83 ක් වෙත ලබා දී තිබීම නිසා අදාළ නිගමනයන් අපේක්ෂිත පරිදි ලැබී නොතිබුණි. තවද වර්තමාන විෂයය නිර්දේශයෙන් ඉවත් කරන ලද රසායන ද්‍රව්‍ය පාසල් වෙත ලබාදීම සඳහා රු. රු.767,543 ක් 2021 වර්ෂයේදී වැය කර තිබුණි. | ඇතැම් පාසල්වල කාර්ය මණ්ඩලය එම රසායන ද්‍රව්‍යය නිවැරදි ආකාරයෙන් පරිහරණය නොකරන බව නිරීක්ෂණය වීම හා පාසල්වලින් සිදු කරන ලද ඉල්ලීම් වල ඇතුළත් රසායනික ද්‍රව්‍ය ලබා දී ඇති බව. | අවශ්‍යතාවයන්ට උචිත වන පරිදි ගුණාත්මක ද්‍රව්‍යයන් මිලදී ගැනීම සිදු කළ යුතුය. |
| (ආ) | පාසල් තුළ කල් ඉකුත් වූ, ඉවත් කළ යුතු ලේබල් රහිත රසායන ද්‍රව්‍ය හා විකිරණශීලි ද්‍රව්‍යයන්ද දිගුකාලයක සිට පැවති අතර එම රසායන ද්‍රව්‍යයන් පරිසරයට මුදාහැරීම වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙළක් සකස් කර නොතිබීම නිසා පාසල් ප්‍රජාව අනාරක්ෂිතතාවයකට පත් වී තිබුණි. මේ සම්බන්ධව පාසල් විසින් කලාප අධ්‍යාපන කාර්යාල දැනුවත් කර තිබුණු අතර මොරටුව වේල්ස් කුමර විද්‍යාලය මඟින් පෞද්ගලික ආයතනයක් හරහා රසායන ද්‍රව්‍ය ඉවත් කිරීමට සැලසුම් කළද ඒ සඳහා වූ වියදම අධික වීම හේතුවෙන් අතරමඟ නවතා තිබුණි. පාසල්වල පවතින මෙම පැරණි රසායන ද්‍රව්‍ය හා එම ද්‍රව්‍ය අපරහණ ක්‍රියාවලිය සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර නොතිබීම පිළිබඳව විගණන හා කළමනාකරණ රැස්වීමේදී වාර **07** කදී පමණ සාකච්ඡා කර තිබුණද, ගැටළුව | රසායන ද්‍රව්‍ය අපහරණය විධිමත් නීත්‍යානුකූල වැඩපිළිවෙලක් ඔස්සේ සිදු කළ යුතු බැවින් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කරමින් පවතී. මේ වන විට කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව වාචිකව දන්වා ඇති බව. | නීත්‍යානුකූල විධිමත් වැඩපිළිවෙලක් සකස් කර අපහරණය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසඳීමට කටයුතු කර නොතිබුණු අතර 2023 සැප්තැම්බර් 06 දින පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් න්‍යායපත්‍රයෙන් එය ඉවත් කර තිබුණි. | | |
| (ඇ) | 2023 වර්ෂය සඳහා වූ නිල ඇඳුම් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂාව සිදු කරන ලද කලාප අධ්‍යාපන කාර්යාල, පාසල් තුළ හා පත්තලගෙදර ගබඩාව තුළද නිල ඇඳුම් පැකට් 1,185,6114 ක් අතිරික්තව පැවතුණි. | එකඟ වෙමි. අවශ්‍යතාවයට වඩා වැඩිපුර චීන රජයෙන් ලද රෙදි ප්‍රමාණය ද රෙදි තොග අතිරික්ත වීමට හේතු වී ඇති බව. | සිසුන් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීම තුළින් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම සිදු කල යුතුය. |
| (ඈ) | මාතර රාහුල විද්‍යාලයේ පැවතුණු රහල් සියවස් විද්‍යාභිමානී අධ්‍යාපනික ප්‍රදර්ශනය හා සැණකෙළිය වෙනුවෙන් ආදි ශිෂ්‍ය සංගමය විසින් ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව අසාමාන්‍ය මිල ගණන් යටතේ විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීමට එකතුව රු.3,185,111 ක් වැයකර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.13 වත්කම් කළමනාකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ අයවැය යෝජනා 92 අනුව ක්‍රියාත්මක වූ උසස්පෙළ සිසුන්ට හා එම විෂය උගන්වන ගුරුවරුන්ට ටැබ් පරිගණක ලබාදීමේ වැඩ සටහන යටතේ ටැබ් පරිගණක 96,919 ක් හා අරෝපිත රාක්ක 2639 ක් මිලදීගැනීමට කටයුතු කර තිබුණද, 6 වසර සිට 11 වසර දක්වා සිසුන් වෙනුවෙන් මෙම ටැබ් පරිගණක ලබාදීම ලෙස, අරමුණු වෙනස් කර තිබුණි.ඉන් වටිනාකම රු.589,035,758 ක් වූ ටැබ් පරිගණක 18,973 ක් හා රු.88,275,000 ක් වූ ආරෝපන රාක්ක 535 ක් බස්නාහිර පළාතේ පාසල් 256 ක් වෙත ලබා දී තිබුණද ඒවායින් බොහොමයක් නිශ්කාර්යව ඌන උපයෝජිතව පැවතුණි. | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට තාක්ෂණය බද්ධ කිරීම ඕනෑම පාඩමකට නොයෙක් ආකාරයෙන් සිදු කල හැකිය. මේ පිළිබඳව ගුරුභවතුන් තවදුරටත් දැනුවත් කරන බව. | ටැබ් පරිගණක උපයෝජනය කර එහි ප්‍රතිලාභ සිසුන්ට ලබා ගැනීමට හැකි වන ලෙස අවශ්‍ය උපදෙස් මාර්ගෝපදේශයන් ලබාදීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පනත අනුව ගැසට් කරන ලද පාසල් හා ගුරු විද්‍යාල සම්බන්ධයෙන්,ඒවායේ නම, පිහිටීම,ගොඩනැගිලි ප්‍රමාණය,ඉඩමේ ප්‍රමාණය, හා විශේෂයෙන් පවරා ගත්තේ කාගෙන්ද ආදී විස්තර පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ පළාත් කාර්යාලවල දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | කෝප් කමිටුවේ නිර්දේශ මත සම්පූර්ණ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමේ මුල් අදියර මේ වන විට අවසන් කර ඇති බව. | අමාත්‍යාංශය විසින් නිවැරදි හා කාලීන තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පනත සම්බන්ධ ගැසට්පත්‍රය අනුව බස්නාහිර පළාතට අයත් පාසල් සංඛ්‍යාව 782 ක් විය. බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති අංශය විසින් උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත යටතේ රජයට පවරාගත් බස්නාහිර පළාත තුළ දැනට ක්‍රියාත්මක වන පාසල් පිළිබඳ 2014 ජනවාරි 31 දිනට ලේඛනයක් පිළියෙළ කර තිබුණු අතර එහි සඳහන් පාසල් සංඛ්‍යාව 489 කි. ඒ අනුව පාසල් 293 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙයින් පාසල් 9 ක් මුල් හිමිකරුවන් වෙත අවසතු කර ඇති අතර තව දුරටත් පාසල් 284 ක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි. | දිවයින පුරා අවසතු කොට ඇති සියළු උපකෘත පාසල් සම්බන්ධ තොරතුරු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු හරහා ලබා ගැනීමට කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටින බව. | අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණය මනාව පවත්වා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර නිවැරදි තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර් රථ 140 ක් අමාත්‍යාංශය සතුව නොපැවතුණි. | අස්ථානගතව ඇති වාහන 141 පිළිබඳ තොරතුරු මේ වන විට නිශ්චිතව සොයා ගැනීමට නොහැකි වීම නිසා දැනට මේ සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නැති බව. | අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි වී ඇති වාහන නිවැරදිව හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 නොවැම්බර් 30 දිනැති අංක ED/08/26/05/3/01 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 13 ඡේදය ප්‍රකාරව ටැබ් පරිගණක යන්ත්‍ර කිසිඳු හේතුවක් මත පාසලෙන් බැහැරට ගෙන යාම නොකළයුතු බව දක්වා තිබුණද විගණක විසින් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී පාසල් 10 ක ටැබ් පරිගණක 39ක් පාසලින් බැහැරට ගෙනගොස් තිබුණි. | දී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස පාසල් හා පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඊ) | නිපුණතා අංශයේ එකතු පිරිවැය රු. 8,800,000 ක් වූ වාහන දෙකක් 2019 ඔක්තෝබර් 10 දින සිට හා 2022 මාර්තු 14 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන අලුත්වැඩියා කිරීම සඳහා මේ වනවිට ඇස්තමේන්තු කැඳවා ඇති අතර ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් අංශය යටතේ පවතින වෙනත් ආයතනයන් වෙත ලබාදීමට කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් මනාව කළමනාකරණය කරමින් උපයෝජනය කළ යුතුය. |

**3.14 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනයේ ආරම්භක ශේෂය ලෙස හානි 08 කට අදාළව රු.16,552,184 ක් වූ වටිනාකමැති අලාභ අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණු අතර 2024 අප්‍රේල් 30 දින වනවිට එම ශේෂය රු.16,527,317 ක් දක්වා අඩු වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව පරීක්ෂණ පවත්වා අලාභ අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට හෝ කටයුතු කල යුතුය. |
| (ආ) | මීගමුව හරිස්චන්ද්‍ර විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියට ලද මුදලින් රු.1,384,225ක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියකු විසින් බැංකු ගත නොකර අයථා ලෙස පරිහරණය කර වර්ෂ 05 කට ආසන්න කලක් ගතව තිබුණද එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර, නිලධාරියා සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොටහේන මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යා පීඨයේ ඇතිවූ හදිසි ගිනි ගැනීම හේතුවෙන් වූ ඇස්තමේන්තු ගත රු.12,517,406ක අලාභය සඳහා අදාළ පරිශ්‍රයට පරිගණක උපාංග සපයන ලද හා අභ්‍යන්තර විදුලි පද්ධති ස්ථාපනය කර ඇති සැපයුම්කරු, සඳහා වගකීව යුතු බවට නිර්දේශ කර ඇතත් මෙම අලාභය හා සියයට 28.75 ක දෙපාර්තමේන්තු ගාස්තු සමග රු.16,116,160ක් වූ මුලු අලාභය සැපයුම්කාර ආයතනයෙන් අයකර ගැනීමට කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සම්පූර්ණ අලාභය සැපයුම්කාර ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.15 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උසස් අධ්‍යාපන අංශය විසින් රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා cloud පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියක් ලබා ගැනීම සඳහා Rollout වියදම් ලෙස විශ්ව විද්‍යාල 17 ක් සඳහා රු. මිලියන 3.9 ක් ගෙවා තිබූ අතර 2018 ජූලි මාසය වන විට දත්ත පවත්වා ගෙන යාම වෙනුවෙන් රු. මිලයන 110 ක බිල්පත් ඉදිරිපත් කර තිබුණි. මෙම පද්ධතිය සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවන විට ඒ සඳහා ගෙවිය යුතු මුදල වැඩිවන බැවින් එම මුදල් ගෙවීමට ඇති හැකියාව පිළිබද සලකා බැලීමෙන් තොරව ගිවිසුම්ගතවීම හේතුකොටගෙන මෙම ව්‍යාපෘති අතහැර දැමීමට කටයුතු කර තිබූ අතර අදාළ සේවා ආයතනය විසින් නීතිමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | පද්ධතිය සදහා අන්තර්ග්‍රහණය වන සිසුන් සංඛ්‍යාව මත ගෙවීම් වැඩිවන බව නිවැරදිය. මෙම පද්ධතිය cloud පාදක දත්ත පද්ධතියක් බැවින් මෙම පද්ධතිය සඳහා ඇතුළත් කළ හැකි සිසුන් සංඛ්‍යාව සීමා රහිත වේ. ඒ අනුව පද්ධතිය සඳහා ඇතුළත් කළ හැකි සිසුන් සංඛ්‍යාව පිළිබඳව මූලික අධ්‍යයනයක් සිදු කිරීමට අවශ්‍ය නොවූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව කර තිබුණි.අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව පිළිබඳව 2013 ඔක්තෝබර් 01 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ නිර්දේශය අනු අංක 03 ක් අවධානය යොමු කර ඇති බව. | බාහිර ආයතනය සමඟ ගිවිසුමකට එළඹීමට පෙර අදාල ගනුදෙනු හා පද්ධතිය සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදුකර අවශ්‍යතාවයන් හා ධාරිතවය නිසි පරිදි හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හා අරමුණු ලඟාකර ගැනීමට බලධාරීන් වග බලා ගත යුතුය. |

## 3.16 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන ගණන් දීමේ නිළධාරී වෙත නිකුත් කළ විගණන විමසුම් 17ක් සඳහා මාස 1 සිට මාස 6 දක්වා කාලයක් ගත වුවද පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.17 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුලස්තිපුර ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය රජයේ නිවාස 29ක් සඳහා 2018 වර්ෂයේදි තක්සේරු කරන ලද ආර්ථික කුලිය අනුමත නොකිරීම හේතුවෙන් 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා රු. 1,446,000 ක කුලී මුදලක් රජයට අහිමි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | රජයට අයත් ආදායම් නිසි පරිදි අයකර ගැනීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 චක්‍රලේඛයට පටහැනිව 6 වසරට නව පන්තියක් ආරම්භ නොකොට අතර මැද වෙනත් පන්ති සඳහා නව පන්ති ආරම්භ කර තිබුණු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය වීම හේතුවෙන් ශිෂ්‍යත්ව කඩඉම් විභාග ලකුණු වලින් එම පාසල්වලට ඇතුලත් විය හැකි ළමුන් ට එම අවස්ථාව අහිමි වී තිබුණි. තවද පන්ති සඳහා පුරප්පාඩු ඇති වීම තුළින් අවිධිමත් ආකාරයෙන් දරුවන් ඇතුළත් කිරීමට පාසල්වල විදුහල්පතිවරුන්ට හැකියාව ලැබී තිබුණු අතර ඒ සඳහා පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහය ප්‍රකාරව ව්‍යුහ කමිටු අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 6 වසර පන්තිය සඳහා ශිෂ්‍යත්ව කඩඉමෙන් ළමුන් ඇතුලත් කිරීමෙන් පසු 7 වසර පන්තිය සඳහා සැලකිය යුතු ලෙස නවක සිසුන් බඳවාගැනීම ඇතැම් පාසල්වලින් සිදුකර තිබුණු අතර මෙය ශිෂ්‍යත්ව කඩඉම සමත් ළමුන් එම පාසල්වලට ඇතුලත් කිරීමට තිබුණු අවස්ථාව අහිමි කිරීමක් වී තිබුණි. ඒ අනුව 7 ශ්‍රේණියේ නව ඇතුළත් කිරීම් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පිළිවෙළින් 470 ක්ද ,503 ක්ද 718 ක්ද, 829 ක්ද ,382 ක්ද , 707 ක් සහ 889 ක්ද වශයෙන් නව ඇතුළත් කිරීම් සිදුකර තිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පාසල් වල **6** වසර පංති ආරම්භ කිරීමේ ධාරිතාවය නිසි පරිදි හඳුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ස්ථාපිත කර එම තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. තවද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නව පංති ආරම්භ කර **5** වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන්ට හිමි සියලු අවස්ථාවන් සැලැස්වීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |
| (ඈ) | 2021 මැයි 28 දිනැති 13/2021 චක්‍රලේඛය හා 2022 ජනවාරි 02 දිනැති අංක 22/1960/607/079 දරණ නිකුත් කල අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1 වසර සිට 5 වසර දක්වා පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40ක්ද 6 වසර සිට 11 වසර දක්වා පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක්ද ලෙස දක්වා තිබෙන අතර මේ තුලින් එක් පන්තියකට ශිෂ්‍යත්වයෙන් තවත් ළමුන් 5 දෙනෙකු ඇතුලත් කර ගැනීමට හැකියාවක් පැවතුනද 5 ශ්‍රේණිය වන විට 40 සීමාව ඉක්මවා ළමුන් පන්තිවලට බඳවාගැනීම සිදුකර තිබුණි. පරීක්ෂාවට භාජනය කල පාසල් 70න් පාසල් 25ක ළමුන් 548 දෙනෙකු මෙම සීමාව ඉක්මවා ඇතුලත් කිරීම සිදු කර තිබීම හේතුවෙන් 6 වසර වන විට පන්තිවල පුරප්පාඩු නොපවතින බැවින් එම පන්ති වලට ශිෂ්‍යත්ව කඩඉමෙන් ළමුන්ට ඇතුලත්වීමට ඇති හැකියාව අහිමි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | පාසල් වල **6** වසර පංති ආරම්භ කිරීමේ ධාරිතාවය නිසි පරිදි හඳුනාගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ස්ථාපිත කර එම තොරතුරු යාවත්කාලීනව පවත්වා ගනිමින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නව පංති ආරම්භ කර **5** වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන්ට හිමි සියලු අවස්ථාවන් සැලැස්වීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය , මිය ගිය විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති සහ සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.170,296,262ක් වූ අතර 2024 අප්‍රේල් 30 දින වන විටත් රු.164,077,248 ක් අයවිය යුතුව තිබුණි. ඉන් රු.16,592,173ක් වර්ෂ 20කට වැඩි කාලයක සිටද රු.30,899,811 ක් වර්ෂ 10ත් වර්ෂ 20ත් අතර කාලයක සිට ද රු.22,264,959 ක් වර්ෂ 5ත් වර්ෂ 10ත් අතර කාලයක සිටද රු.94,320,305 ක් වර්ෂ 5 ට අඩු කාලයක සිටද හිගව පැවතුණි. | ණය ශේෂ හා වසර 5 ට වැඩි ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට සියළුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ අදාළ සියළුම ඒකක දැනුවත් කර ඇති අතර එම ගිණුම් ඒකක මේ වන විට එම කටයුතු සිදු කරමින් පවතින බව. | හිග ණය ශේෂ අයකර ගැනිමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී පැමිණ සහ නිලධාරින්ගෙන් වැඩිපුර ගෙවීම් ලෙස අයකර ගැනීමට ඇති ණය ශේෂය රු.41,563,841ක් වන අතර 2024 අප්‍රේල් 30 දින වන විටත් රු.39,950,191 ක් අය විය යුතුව තිබුණි. ඉන් රු.9,597,722 ක් වසර 20කට වැඩි කාලය සිටද රු.9,144,756ක් වසර 10ත් 20ත් අතර කාලයක සිටද රු.4,903,471ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද රු.16,304,242 ක් වර්ෂ 5ට අඩු කාලයක සිට ද පැවතුණි. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට සියළුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ අදාළ සියළුම ඒකක දැනුවත් කර ඇති අතර එම ගිණුම් ඒකක මේ වන එම කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිග ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (උ) | අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ධාරිතාවය ආසන 25 සිට ආසන 320 දක්වා වූ ශ්‍රවණාගාර හා කමිටු රැස්වීම් ශාලා 06ක් තිබියදීත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වැඩමුළුවලින් විශාල ප්‍රමාණයක් බාහිර ආයතනවල දේශන ශාලා භාවිත කර ඒ සඳහා රු.10,587,237ක් වැය කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | රජයේ සම්පත් උපරිමව භාවිතා කිරීමටත් ආර්ථිකමය වාසි සැලසෙන ලෙස තීරණ ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඌ) | ජනප්‍රිය පාසල් සඳහා 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදි පාසලට ආසන්නතාව මත ලබාදෙන ලකුණු 50 ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පාසලට ආසන්නතම ලිපිනයක බදු ගිවිසුම්ගත වීම සිදු කර තිබීම නිසා දීර්ඝ කාලයක සිට එම ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සහිත දරුවන්ට පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නිවැරදි බව හා සත්‍ය බව තහවුරු කරගත හැකි පරිදි පවත්නා ගැටලුකාරී තත්ත්වයන්ද සැළකිල්ලට ගෙන තාර්කික නිර්ණායක පදනම්ව චක්‍රලේඛ විධිවිධාන හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | කොළඹ ඩී.එස්.සේනානායක විද්‍යාලයට පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ආසන්න පදිංචිකරුවන් බවට සනාථ කිරීම සඳහා දරුවන්ගේ අයදුම්පත් සමඟ කූට ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආයතන) සහභාගිත්වයෙන් හා සාමාජිකයන් 5 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතු කමිටුවක් විසින් විමර්ශනයක් සිදුකර තිබුණි. එම විමර්ශනයට අදාළ 2024 මාර්තු 22 දිනැති අංක ED/05/91/30/08-2024 දරන අතුරු වාර්තාව ප්‍රකාරව අනුව ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් යන ගණය යටතේ පාසල සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් 57 දෙනෙකුගෙන් අයදුම්කරුවන් 47 ක් විසින්ම කූට ලේඛන ඉදිරිපත් කර තිබුණු අතර ඉන් ව්‍යාජ ග්‍රාම නිළධාරී සහතික ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් 43 දෙනෙකු සිටින බවට අදාළ ග්‍රාම නිළධාරීන් මගින් තහවුරු කරගෙන තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත | විමර්ශන කටයුතු නොපමාව අවසන් කර අවශ්‍ය විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ ) | නිපුණතා අංශයේ ප්‍රධානතම අරමුණක් වූ වෘත්තීය රැකියා ක්ෂේත්‍රයට යොමුවීම සම්බන්ධයෙන් කරන ලද ඇගයීමේදී එක් දෙපාර්තමේන්තුවකින් හා ව්‍යාවස්ථාපිත ආයතන 20 කින් වෘත්තීය පුහුණුව අවසන් කල පුහුණුලාභීන්ගේ රැකියාගතවීම් සම්බන්ධව පසුවිපරම් වැඩසටහන් ක්‍රියාත්මක නොවන අතර පුහුණුලාභීන් රැකියාගතවීම් පිළිබඳ දත්ත පද්ධතියක්ද නොතිබුණි. එබැවින් 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වන රු.11,963,000,000 කින් රු.9,737,862,020 ක් වියදමක් දරා රටට ලබාදුන් වෘත්තීය පුහුණු ශ්‍රම බලකා ප්‍රමාණය කොපමණද යන්න හා රජය විසින් දරන ලද වියදමට ප්‍රමාණවත් කාර්යසාධනයක් ලබා ගත බව ඇගයීම් කිරීමට නොහැකි විය. | වෘත්තීය පුහුණු ආයතන විසින් ඉදිරිපත්කර ඇති තොරතුරු අනුව එම ආයතන වලින් පාඨමාලා සම්පූර්ණ කර පිටව යන විද්‍යාර්ථයන්ගේ /පුහුණුලාභීන්ගේ රැකියාගත වීම පිළිබඳ තොරතුරු රැස්කිරීම /පසුවිපරම් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පසුවිපරම් උදෘතයන්/දත්ත රැස්කිරීමේ පත්‍රිකා හඳුන්වා දීම, සමීක්ෂණ පැවැත්වීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | විශ්ලේෂණාත්මකව දත්ත පද්ධතියක් පවත්වා ගනිමින් වියදම් කළ මුදලට සාපේක්ෂව ප්‍රතිලාභ අත්කර තිබේද යන්න පිළිබඳව ඇගයීමක්ද සිදු කළ යුතුය. එය ඉදිරි සැලසුම්කරනයන් සඳහා දායක කර ගැනීමට බලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඔ) | ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා කර්මාන්ත හා සේවා අංශවල නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක් එක් කිරීමේ කාර්යයභාරය ඉටුකර ගැනිමට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 474 ක් සඳහා හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් පිළිවෙළින් 317 දෙනෙක් හා 58 දෙනෙක් අනුයුක්ත කර තිබුණි. එහෙත් 2023 වර්ෂයේ කාර්යසාධනය ඇගයීමේදී එම නිලධාරීන්ට පවරා තිබුණු ප්‍රධාන කාර්යයන් 22 න් 18 කට | මෙම තත්ත්වය මඟහරවා ගැනීමට ක්ෂේත්‍ර නිලධාරීන්ට උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දි ඇත. ඒ අනුව මෙම නිලධාරීන් ප්‍රගතිය කාර්තුමය වශයෙන් අධීක්ෂණය කිරීමටත්, ඔවුන් හට අවශ්‍ය | දක්ෂතා වලින් හෙබි තරුණ පරපුරක් බිහි කිරීමේ ප්‍රධාන අරමුණු ඉටුවන අයුරින් නිසි අධීක්ෂණයක් හා පසුවිපරමක් සිදු කරමින් නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාලව වර්ෂයේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 35 දක්වා පහල අගයක් වී තිබුණි. | ඉලක්ක ලබා දීමටත් කටයුතු කර ඇති බව. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු 1,623 ක් පැවැතීම හේතුවෙන් හා අනෙකුත් පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශ කටයුතුවලදී අවහිරතා මතුවී තිබුණි. 2023 වර්ෂයේදී අමාත්‍යාංශය යටතේ ඇති උසස් අධ්‍යාපන අංශය,නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපනය, ග්‍රහලෝකාගාරය හා විදාතා වැඩසටහන සඳහා යොදන ලද නිලධාරීන්ගේ පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු.710,054,051 ක් ගෙවා තිබුණු නමුත් එම සේවක සංඛ්‍යාව පිළිබඳ දත්තයන් ඉහත සංඛ්‍යා යටතට ඇතුළත්ව නොතිබුණි. අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්වල විදුහල්පති, ගුරු භවතුන්, වෙනත් අධ්‍යාපන අංහ හා පිරිවෙන් අංශයේ කාර්ය මණ්ඩලයද ඇතුළත් වී නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම තොරතුරු අමාත්‍යාංශය සතුව නොපැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අමාත්‍යාංශයේ සියළුම කර්ය මණ්ඩල තොරතුරු ඇතුලත් වන පරිදි මානව සම්පත් පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කර යාවත්කාලීනව පවත්වා ගනිමින් මානව සම්පත් කළමනාකරණය කළ යුතුය . |
| (ආ) | 2017 සැප්තැම්බර් 20 දිනැත අංක 4/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම, ඉල්ලා අස්වීම , සේවක අතහැර යෑම්, සේවයෙන් අස්කිරීම් , විශ්‍රාම ගැන්වීම්, හා මිය යෑම් , වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් 2023 වර්ෂයට එම අදාළ වාර්තාව අර්ධ වාර්ෂිකව 2024 වර්ෂයේ ජනවාරි හා මාර්තු යන මාසවලදී ඉදිරිපත් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට අදාළ කාර්ය මණ්ඩලය දැනුම් දීමේදී අමාත්‍යාංශ ජාතික පාසල් අධ්‍යයන කාර්ය මණ්ඩලය, උසස් අධ්‍යාපන කාර්ය මණ්ඩලය හා පිරිවෙන් අංශයේ කාර්ය මණ්ඩල සම්බන්ධ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තම්න්තුව වෙත යවා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර මානව සම්පත් කළමනාකරණය විධිමත්ව පවත්වා ගෙන යා යුතුය. |